සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

වාර්ෂික වාර්තාව
2022-2023

පටුන

දැක්ම, මෙහෙවර සහ ආයතනික අරමුණු.....04

අරමුණු, කර්තව්‍යයන්, සේවාවන් සහ වසර තුළ ප්‍රගතිය.....05

සංස්ථාපිත තොරතුරු.....06

සභාපතිතුමාගේ පණිවිඩය.....07

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 08

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්.....09 - 10

නිෂ්පාදන කළඹ.....11 - 13

ව්‍යාපාර සමාලෝචනය.....14

රැකියා උත්පාදනය.....15

ආයතනික පාලනය.....16

විශේෂ මූල්‍ය සිදුවීම්.....17

විශේෂ මූල්‍ය සිදුවීම්වල ප්‍රස්ථාරික නිරූපණය.....18 - 19

සංස්ථාවේ අංශයන්හි කාර්යසාධනය.....20 - 21

විගණකාධිපති වාර්තාව.....22 - 32

විස්තීරණ ආදායම් ප්‍රකාශනය.....33

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව.....34

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය.....35

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....36 - 37

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.....38 - 55

දැක්ම, මෙහෙවර සහ ආයතනික අරමුණු

අපගේ දැක්ම

දේශීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවට ආසියාවේ වාණිජ කේන්ද්‍රස්ථානය වීමට සහාය වීමේ අරමුණින්
පාර්ශවකාර අභිලාෂ පවත්වා ගනිමින් අනෙකුත් සියලු අංශවල අවශ්‍යතා සපුරාලන අතර
මූලිකවම රාජ්‍ය අංශයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස
ඊට අවශ්‍ය සියලු නිෂ්පාදන හා සේවා සැපයීම.

ආයතනික අරමුණු

සාධාරණ ඉපැයුම් ඉපැයීම, පුද්ගල හා වෘත්තීය සංවර්ධනයට දායකවීම සහ
විශේෂිත සන්නාම හරහා නිෂ්පාදන නායකත්වය ස්ථාපිත කිරීම.

අරමුණු, කර්තව්‍ය, සේවාවන් සහ වසර තුළ ප්‍රගතිය

මෙහෙයුම් අරමුණු

- විවිධත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා විකුණුම තුළින් වෙළඳපොළ ස්ථාවර කිරීම.
- කීර්තිමත් සහ විශ්වසනීය ජාත්‍යන්තර සන්නාම අප රට තුළ නියෝජනය කිරීම.
- ආයතනයේ ආදායම සහ ලාභය වර්ධනය කිරීම මගින් එහි කීර්තිනාමය ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ අවශ්‍යතා ඵලදායීව සැපයීම මගින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම.
- ආයතනයේ ප්‍රධාන නිෂ්පාදන හරහා පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති, පාරිභෝගිකයන් සහ කාර්යමණ්ඩලය කෙරෙහි නිරන්තර අවධානය යොමුකිරීම මගින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.

මෙහෙයුම් උපායමාර්ග

- පාරිභෝගික පදනම සහ ප්‍රවේශ්‍යණතාව පුළුල් කිරීම.
- පාරිභෝගික අවශ්‍යතාවය අනුව නිෂ්පාදන කළඹ ඉහළ නැංවීම.
- මෙහෙයුම් සම්පත් කළමනාකරණය තුළින් වෙඩි සබල ව්‍යාපාරික කළමනාකරණය සහ දත්ත කළමනාකරණය සහ ප්‍රසම්පාදන අනුමතිය.
- ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයන්හි සක්‍රීය සහ සඵල සහභාගිත්වය.

වසර තුළ ප්‍රගතිය

මෙම වසරේ ආයතනයේ ව්‍යාපාරික ආදායම රු. මිලියන 9,417ක් ලෙස වාර්තා විය. සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් මෙහෙයුම් ආදායම රු. මිලියන 35 කි. බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 731 ක් ලෙස පෙන්නුම් කළ අතර මුළු ස්කන්ධ ප්‍රමාණය වසර තුළ රු. මිලියන 1782 දක්වා වැඩි වුණි.

2023 මාර්තු අවසන් වන විට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 336 ක් විය.

නිෂ්පාදන ආයතන සමග හවුල්කාරිත්වයෙන් අපගේම STC සන්නාමය සහිත නිෂ්පාදන ස්ථාපිත කිරීමට අප සැලසුම් කර ඇති අතර නිෂ්පාදන මාලාවක් සැලසුම් කරමින් පවතී.

සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම : සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

නෛතික තත්ත්වය : 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ එස්.ටී.සී. ජෙනරල් ට්‍රේඩිං සමාගම වශයෙන් පැවැති නම 2010.10.01 දින ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව ලෙස වෙනස් කරන ලදී. පූර්වයෙන්, 1982 අංක 17 දරන රාජ්‍ය සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම ලෙස ස්ථාපිත කරනු ලැබූ එය ඊට පෙර 1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ලෙසින් හඳුන්වනු ලැබීය. සමාගම මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අනුබද්ධව පවතී.

සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂක :

ආසිරි වලිසුන්දර මහතා	-	(2022.09.05 සම්බන්ධ විය)
යෝගා පෙරේරා මහතා	-	(2022.09.05 දින ඉල්ලා අස්විය)

අධ්‍යක්ෂක මණ්ඩලය :

ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා	-	(2020.01.20 දින සම්බන්ධ විය)
යූ. දිසානායක මහතා	-	(2022.08.09 දින ඉල්ලා අස්විය)
ඩී. ජේ. විදානච්චි මහතා	-	(2022.08.12 දින ඉල්ලා අස්විය)
ජී. දහනායක මහත්මිය	-	(2020.02.05 දින සම්බන්ධ විය)
ටී. ඒ. ඩී. රංජිත් මහතා	-	(2022.09.09 දින නැවත සම්බන්ධ විය)
සී. පීරිස් මහතා	-	(2022.11.12 දින සම්බන්ධ විය)
කේ. ආර්. එස්. පෙරේරා මහතා	-	(2023.01.20 දින සම්බන්ධ විය)
කේ. සත්‍යකුමාර් මහතා	-	(2023.03.02 දින සම්බන්ධ විය)

සමාගම් ලේකම් : ඒ. ඩබ්ලිව්. මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම

විගණක :
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
අංක. 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

බැංකුකරුවන් :
මහජන බැංකුව
ජාතික සංවර්ධන බැංකුව
සම්පත් බැංකුව
ලංකා බැංකුව

ලියාපදිංචි කාර්යාලය :
100, නවම් මාවත,
කොළඹ - 02,
ශ්‍රී ලංකාව.
දුරකථනය : +94 112 422341-4, +94 112 440880
ෆැක්ස් : +94 112 447970
විද්‍යුත් තැපෑල : lankagen@sltnet.lk
වෙබ් අඩවිය : www.stc.lk

සමාගම් ලියාපදිංචි අංකය : PB 863

සේවක සංඛ්‍යාව : අවසන් වූ වර්ෂය තුළ සමාගම විසින් සේවකයන් 336 දෙනෙකු සේවයේ යොදවන ලදී.

සභාපතිතුමාගේ පණිවිඩය

2022/2023 වසර සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට මම කැමැත්තෙමි.

බාහිර පාරිසරික බිහිදසුන

2022/2023 මූල්‍ය වර්ෂය ආරම්භයේදී ශ්‍රී ලංකාව උග්‍ර ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටියේය. 2021 වසර අවසානයේදී දළ ජාතික නිෂ්පාදිත අනුපාතය 1.4% ක්ව පැවැති අතර අධික උද්ධමනය, විදේශ සංචිත හිඟය සහ දුර්වල පරිපාලනය, වෙළඳ සීමා සහ මූල්‍ය විනයක් නොමැති වීම ඇතුළු සැලකිය යුතු අභියෝග හේතුවෙන් 2022-2023 මූල්‍ය වර්ෂය ආරම්භයේදී දළ ජාතික නිෂ්පාදිතය - 7.4% දක්වා පහත බැස තිබුණි. මෙම උග්‍ර ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලය වූයේ රැකියා අහිමිවීම, දරිද්‍රතාවය ඉහළ යාම සහ අසමානතාව පුළුල් වීමයි. රජයේ වියදම් අඩු කිරීම, ආනයන සීමා පැනවීම, බදු ප්‍රතිසංස්කරණ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ අනෙකුත් සංවර්ධන පාර්ශවකරුවන්ගේ සහාය ඉල්ලා සිටීම වැනි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් රජය ඒ සඳහා ප්‍රතිචාර දැක්වීය. එසේම, පහළ යමින් පැවැති පොළී අනුපාත ඉහළ නැංවුණු විදේශ සංචිත සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා දායක වෙමින් මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති ගැලපුම් සිදු කරන ලදී. මූල්‍ය ප්‍රතිපත්තියේ සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ මෙම සියලු වෙනස්කම් 2022/2023 වසර පුරාම පැවැතුණි.

මෙම අභියෝගාත්මක කාල සීමාව තුළ ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය බල ගැන්වීම වෙනුවෙන් මහජන විශ්වාසය යළි ස්ථාපිත කිරීම සහ වඩා හොඳ මහජන සේවා සැපයීම පිණිස අඛණ්ඩ ප්‍රතිසංස්කරණ, විචක්ෂණ මූල්‍ය කළමනාකරණය සහ විවෘතභාවය සඳහා අවශ්‍යතාව රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව අවධාරණය කරන ලදී.

කාර්යසාධන සමාලෝචනය

රටේ පැවැති ආර්ථික අවපාතය මධ්‍යයේ වුව ද, 2022/2023 වසරේ බදුවලින් පසු රු. මිලියන 533 ක ශුද්ධ ලාභයක් සංස්ථාව වාර්තා කළ බව මම ඉමහත් සතුටින් දන්වා සිටින අතර එය 2021/22 මූල්‍ය වර්ෂය හා සැසඳීමේදි 24% ක වර්ධනයකි. එසේම පෙර වසරට සාපේක්ෂව 7.6%ක වර්ධනයක් සනිටුහන් කරමින් 11% ක දළ ලාභ ආන්තිකයක් සහිතව සමාගමේ වාර්ෂික පිරිවැටුම රු. මිලියන 9417 ක් කරා ළඟා වුණි. රේඛීය අමාත්‍යාංශය, සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංස්ථාවේ කළමනාකරණය විසින් ගනු ලැබූ නිවැරැදි සහ කාලෝචිත තීරණ මෙම සාධනීය ප්‍රතිඵල සඳහා හේතු කාරක විය.

ආර්ථිකයේ වෙනස් වෙමින් පැවැති පොළී අනුපාත උපරිම වාසිදායක අයුරින් යොදා ගැනීම මගින් කෙටි කාලීන ආයෝජනවල ආයෝජන ඉහළ නැංවීම සහ සමාගමේ මූල්‍ය ප්‍රවාහය සඵලව කළමනාකරණය කිරීම වැනි පියවර ක්‍රියාවට නැංවීම හරහා ශුද්ධ මූල්‍ය ආදායම රු. මිලියන 348 දක්වා වර්ධනය කර ගැනීමට අපට හැකි වුණි. අභාවිත සහ සෙමින් අලෙවි වන තොග අයිතම බැහැර කිරීම පිණිස තවදුරටත් ක්‍රියා මාර්ග ගන්නා ලද අතර ණය ගැතියන් සම්බන්ධයෙන් ගත් කළ ණය කාල සීමාව අවම කිරීම හා මුදල් ප්‍රවාහය ශක්තිමත් කිරීම පිණිස ණය ප්‍රතිපත්තිය හා දැඩිව අනුකූලත්වය පවත්වා ගන්නා ලදී. 2023 මාර්තු 31 වන විට සමාගමේ කාර්ය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව 336 ක් විය.

සමාජ වගකීම්

රජය මගින් පාලනය කරනු ලබන මිල මට්ටම්වල මිල පවත්වා ගැනීම සහතික කිරීම මගින් සිල්ලර වෙළඳපොළෙහි පාරිභෝජ්‍ය ද්‍රව්‍යවල මිල ස්ථාවර කිරීමේ ප්‍රයත්නයේදී , රජයේ ප්‍රධාන වෙළඳ ආයතනය ලෙස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ඒ සඳහා සක්‍රීයව සහභාගි විය. තවද, ආර්ථික අවපාතයක් මධ්‍යයේ පවා සංස්ථාව පාරිභෝගික අවශ්‍යතා සාර්ථක අයුරින් උපරිම මට්ටමින් සපුරාලන ලදී.


අනාගත සැලසුම්

- වෙළඳපොළ මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීම පිණිස අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය හා බෙදා හැරීම හා වෙළඳපොළ සැපයුම සුසංවිධිත කිරීම. එහි මූලික පියවරක් ලෙස, සහල් ආනයනය කර රජයේ සිල්ලර වෙළඳ ආයතනය හරහා බෙදා හරින ලදී. එසේම වෙළඳ පොළේ පවතින බිත්තර හිඟය සපුරාලීම සහ වෙළඳ පොළ මිල ගණන් ස්ථාවර කිරීම පිණිස බිත්තර ආනයනය කිරීම සහ බෙදා හැරීම සංස්ථාව දැනටමත් ආරම්භ කර තිබේ.

- පවතින නිෂ්පාදන කළඹට නව නිෂ්පාදන හඳුන්වා දීම මගින් අමතර අලෙවි අතිරේක වර්ධනයක් සපුරා ගැනීම.

- තව තවත් රාජ්‍ය අංශයේ ආයතන සහ පුද්ගලික අංශයේ ආයතන දක්වා පාරිභෝගික පදනම ව්‍යාප්ත කිරීම මගින් පිරිවැටුම ඉහළ නංවා ගැනීම.

ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ කාර්ය මණ්ඩල සමාජිකයන්ගේ සහයෝගය අපේක්ෂා කරමින් , ගරු මුදල් අමාත්‍යතුමන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සහෝදර සාමාජිකයන් ලබා දුන් දූර දර්ශී මග පෙන්වීම වෙනුවෙන් මාගේ කෘතඥ පූර්වක ඇගයීම පළ කිරීමට කැමැත්තෙමි. එසේම අපගේ බැංකුකරුවන් සහ මූල්‍ය වර්ෂය තුළ අපගේ සාර්ථකත්වය සඳහා දායකවූ සියලු පාර්ශවකරුවන්ට ස්තූතිය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කර ගන්නා අතර ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය තව දුරටත් අපේක්ෂා කරන්නෙමු.



ආසිරි වලිසුන්දර
සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2023 මාර්තු 31න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා (රාජ්‍ය) වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ විගණිත මූල්‍යම ප්‍රකාශන සහ ශේෂ පත්‍රය සමගින් සිය වාර්තාව අධ්‍යක්ෂවරුන් සාමාජිකයන් වෙත ඉදිරිපත් කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්
ශ්‍රී ලංකා (රාජ්‍ය) වාණිජ විවිධ නීතිගත සංස්ථාව මූලිකවම වෙළඳ කටයුතුවල නිරත වන අතර ප්‍රධාන කොටම රාජ්‍ය අංශයේ ආයතනවල කාර්යාලීය අවශ්‍යතා සපුරාලයි. අපගේ නිෂ්පාදන කළඹට කාර්යාල සැපයුම් හා උපකරණ, ගෙදර දොර උපකරණ, තොරතුරු සන්නිවේදන හා විදුලි සංදේශ උපාංග, විදුලි හා විද්‍යුත් උපාංග, වේගයෙන් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ, ටයර් සහ වාහන බැටරි, කෘෂිකාර්මික උපකරණ හා මෙවලම්, අභ්‍යන්තර අලංකරණ ද්‍රව්‍ය සහ කාර්යාල ගෘහ භාණ්ඩ, රසායනික ද්‍රව්‍ය, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ තීරු බදු රහිත මෙහෙයුම අයත් වේ. ඊට අමතරව, පරිභෝජ්‍ය වෙළඳපොලේ සැපයුම් හා මිලකරණය සුසංවිධිත කිරීම සඳහා මැදිහත් වීමට රජයට අවශ්‍ය වන සෑම අවස්ථාවකම, පාරිභෝගික භාණ්ඩ සහ ආහාර ද්‍රව්‍ය ප්‍රධානතම ආනයනකරු හා බෙදා හරින්නා ලෙස ශ්‍රී ලංකා (රාජ්‍ය) වාණිජ විවිධ නීතිගත සංස්ථාව කටයුතු කරයි. සහල් සහ බිත්තර ආනයනය කිරීමේදී සංස්ථාව එම පදනමින් ඒ හා සම්බන්ධ වූ අතර සාර්ථකව එම ක්‍රියාදාමය ඉටු කරන ලදී.

අධ්‍යක්ෂවරු
මෙම වාර්තාවේ දිනට සමාගමේ ධුර දරන අධ්‍යක්ෂවරු වාර්ෂික වාර්තාවේ ආයතනික තොරතුරුවල සඳහන් කර ඇති පරිදි වේ.

මූල්‍ය ප්‍රතිඵල
2022/2023 වසර සඳහා මූල්‍ය ප්‍රතිඵල අනුව පිරිවැටුමේ සහ ශුද්ධ ලාභයේ ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි.

	පිරිවැටුම රු.මිලියන	දළ ලාභය රු.මිලියන	ශුද්ධ ලාභය රු.මිලියන
2022/2023 සඳහා මූල්‍ය කාර්ය සාධනය	9416.8	1019.2	532.8

කොටස් නිකුතුව - රු.10/- බැගින් සාමාන්‍ය කොටස් මිලියන 10 ක්

සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහයේ කිසිදු වෙනසක් සිදුව නොමැත. 2022/2023 කාල සීමාව තුළදී නව කොටස් නිකුත් කිරීමක් සිදු නොවුණි.

ලභාංශ
වත්මන් මූල්‍ය වර්ෂය වන 2022/2023 වෙනුවෙන් කොටසක් සඳහා රු.5.00 ක අතුරු ලාභාංශයක් අධ්‍යක්ෂවරුන් නිර්දේශ කර තිබේ.

සංචිත හා ප්‍රතිපාදන
2022/2023 මූල්‍ය වර්ෂය තුළදී, රු. 104,369,977 ක ප්‍රත්‍යාගණන සංචිතයක් උපද්දවමින් මෝටර් රථ ඇණිය ප්‍රත්‍යාගණනය කිරීමක් සිදු කරනු ලැබූ අතර රු. 9,330,000 ක ප්‍රත්‍යාගණන සංචිතයක් උපද්දවමින් පරිගණක මෘදුකාංග පද්ධතියේ ප්‍රත්‍යාගණනය කිරීමක් සිදු කරන ලදී. රු. මිලියන 113.6 ක් වූ සමස්ත ප්‍රත්‍යාගණන සංචිතය මූල්‍ය ප්‍රාකාශනවල ප්‍රත්‍යාගණන සංචිතයට ගන්නා ලදී.

2022/2023 වසර සඳහා ලාභය ගණනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රු. මිලියන 104 ක් වූ අඩමාන ණය හානිකරන ප්‍රතිපාදනයක් සලස්වනු ලැබීය.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්
2022/2023 වසර තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පවත්වන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින භාණ්ඩාගාර නියෝජිතයා කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදී. පහත දැක්වෙනුයේ 2022/2023 වසර තුළදී විගණන කමිටුව පත් කරනු ලැබ එය නියෝජනය කළ සාමාජිකයන්ය.

අධ්‍යක්ෂවරයාගේ නම	වි.ක.කමිටුවේ තනතුර
කේ. සත්‍යකුමාර් මහතා	සභාපති
දිනේෂ් විද්‍යානාරච්චි මහතා	සාමාජික (2022.08.12 දින ඉල්ලා අස්විය)
දුලාන් හෙට්ටිආරච්චි මහතා	සාමාජික
ගිල්මා දහනායක මිය	සාමාජික

විගණන කටයුතුවල විෂය පථය ආවරණය කරන්නා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සාමාජිකයන් විසින් අනුමත කරනු ලැබීය. ප්‍රගතිය පෙන්නුම් කිරීම පිණිස, එසේ අනුමත කරනු ලැබූ සැලැස්ම වරින් වර සමාලෝචනය කර සාරාංශගත කරන ලදී.

සේවක සංඛ්‍යාව
මූල්‍ය වර්ෂය අවසාන වන විට සමාගමේ සේවකයන් සංඛ්‍යාව 336 ක් වූ අතර ඊට ඉහළ කළමනාකරණයේ 04 දෙනෙකු ද, මධ්‍ය කළමනාකරණ මට්ටමේ 04 දෙනෙකු ද, කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ 20 දෙනෙකු ද අනෙකුත් ශ්‍රේණිවල සාමාජිකයන් 308 දෙනෙකු ද අයත් විය.

විගණකවරු
රෙගුලාසි ප්‍රකාරව විගණක ලෙස දිගටම කටයුතු කිරීම පිණිස විගණකාධිපතිවරයා නැවැත පත්කරන ලදී.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

සභාපති

අධ්‍යක්ෂ

ජෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්

ජෙෂ්ඨ කළමනාකාරිත්වය	නම
සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ	ආසිරි වලිසුන්දර මහතා
සාමාන්‍යාධිකාරී	චමිලා ඉද්දමල්ගොඩ මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලවි	එම්. එන්. මහේෂ් මෙන්ඩිස් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය	අයි. එම්. ඩී. කේ. ඉලංගසිංහ මිය

අංශ ප්‍රධානීන්

රසායන ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන අංශය

සහකාර කළමනාකරු	කේ. එච්. ගුණවර්ධන මහතා

කාර්යාල උපකරණ සැපයුම් අංශය

සහකාර කළමනාකරු	නිමල්කා රණසිංහ මෙනවිය

ගෘහ උපකරණ අංශය

ස්ථානභාර නිලධාරී	කුමාරි පෙරේරා මිය

තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය

සහකාර කළමනාකරු - විකුණුම්	මධුක බණ්ඩාර මහතා

විදුලි හා විද්‍යුත් උපකරණ අංශය

කළමනාකරු	කේ. ජී. සී. ජනක මහතා

කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හා උපකරණ අංශය

සහකාර කළමනාකරු	මධුශානි අකුරුගොඩ මිය

ඉදිකිරීම්, ලෝහ භාණ්ඩ සහ කාර්යාල ගෘහභාණ්ඩ අංශය

සහකාර කළමනාකරු	අනුරුද්ධ මහේෂ් මහතා

වාහන නිපැයුම් අංශය

ස්ථානභාර නිලධාරී	ඩී. ප්‍රදීප් කුමාර මහතා

පාරිභෝගික භාණ්ඩ අංශය

ස්ථානභාර නිලධාරී	ඩී. ප්‍රදීප් කුමාර මහතා

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්

අංශ ප්‍රධානීන්	නම
තීරු බදු රහිත වෙළඳ අංශය	
සහකාර කළමනාකරු	කේ. ජී. සී. ජනක මහතා
ප්‍රසම්පාදන අංශය	
වැඩබලන ජ්‍යෙෂ්ඨ කළමනාකරු	නිරෝෂ් බණ්ඩාර මහතා
මූල්‍ය අංශය	
මූල්‍ය කළමනාකරු	අයි. කේ. පී. පී. පෙරේරා මිය
සහකාර කළමනාකරු	එන්. යූ. ඩී. අල්විස් මෙනෙවිය
සහකාර කළමනාකරු	පී. ආර්. ඩී. පීරිස් මිය
සහකාර කළමනාකරු	එම්. ඊ. ඉලිපන්ගමුව මෙනෙවිය
තොරතුරු තාක්ෂණ අංශය	
වැඩ බලන ජ්‍යෙෂ්ඨ කළමනාකරු	නිරෝෂ් බණ්ඩාර මහතා
සේවා සහ සැපයුම් අංශය	
සහකාර කළමනාකරු	කේ. එච්. අනුපමා පීරිස් මිය
ප්‍රවාහන අංශය	
සහකාර කළමනාකරු	ඒ. ආර්. මොහොමඩ් ෆස්නූන් මහතා
විගණන අංශය	
සහකාර අභ්‍යන්තර විගණක	එම්. මදුෂා අමාලි ඩයස් මිය
මානව සම්පත් හා නීති අංශය	
නීති නිලධාරිණී	ලක්මාලි කුලරත්න මිය
කළමනාකරු	දර්ශනා පතිරණ මිය

ශාඛා සහ ප්‍රදර්ශනාගාර

01. නවම් මාවත ප්‍රදර්ශනාගාරය	අංක 100, නවම් මාවත, කොළඹ 02.
02. කුරුණෑගල ප්‍රදර්ශනාගාරය	අංක 243/3/1, පුත්තලම් පාර, කුරුණෑගල.
03. මහනුවර ප්‍රදර්ශනාගාරය	අංක 449, විලියම් ගොපල්ලව මාවත, නුවර.
04. මාතර ප්‍රදර්ශනාගාරය	අංක 11, YMCA ගොඩනැගිල්ල, දුම්රියපල පාර, මාතර.
05. අනුරාධපුර ප්‍රදර්ශනාගාරය	අංක 561-B, 38 4වෙනි පටුමග, අනුරාධපුර.
06. යාපනය ප්‍රදර්ශනාගාරය	අංක 127, MPCS ගොඩනැගිල්ල, කන්කසන්තුරේ පාර, යාපනය.
07. මඩකලපුව ප්‍රදර්ශනාගාරය	අංක 32A සහ 32B, නව කල්මුනේ පාර, මඩකලපුව.

අපේ නිෂ්පාදන කළඹ



කාර්යාල සැපයුම් හා උපකරණ

ඩබල් A සහ අනෙකුත් ඡායා පිටපත් කඩදාසි, පුවරු, කඩදාසි වර්ග, පොත්, ෆයිල් කවර හා ෆෝල්ඩර, ලියුම් කවර, කාර්යාල බෑග් සහ බ්‍රීෆ්කේස්, පෑන් සහ පැන්සල්, වයිට් බෝඩ්, සලකුණු කිරීමේ පෑන්, කතුරු, කඩදාසි කැපීමේ පිහි සහ කඩදාසි තිරු කිරීමේ යන්ත්‍ර, කැල්කියුලේටර, ස්ටේප්ලර් සහ සිදුරුකරන, සීඩී තැටි සහ ඩීවීඩී තැටි, යූඑස්බී ඩ්‍රයිව් සහ අනෙකුත් ලිපි ද්‍රව්‍ය.

ගෘහ උපකරණ

ඇළුමිනියම් භාණ්ඩ, පෝසිලේන් නිෂ්පාදන, නන්ස්ටික් මුළුතැන්ගෙයි භාණ්ඩ, සියලු අකාරයේ පිරිසිදු කිරීමේ නිෂ්පාදන, ක්‍රීඩා භාණ්ඩ, සියලු ආකාරයේ ප්ලාස්ටික් නිෂ්පාදන, කෝප්ප සහ පීරිසි, හැඳි ගෑරුප්පු පිහි ආදිය සහ පිඟන් බඳු, කේතල සහ ජෝග්ගු, රාක්ක සහ බන්දේසි, උණු වතුර බෝතල්, ජල පෙරණ සහ පිරිසිදුකාරක, කොට්ට, මෙට්ට සහ ඇඳ ඇතිරිලි, රබර් සහ කොහු පාපිසි, කිරුම් උපකරණ, වැහි කබා සහ කුඩ, අත්පිස්නා, කඩදාසි අත්පිස්නා, අනෙකුත් කඩදාසි නිෂ්පාදන සහ බිත්ති ඔරලෝසු.





තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන උපාංග

ලැප්ටොප් පරිගණක, ඩෙස්ක්ටොප් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, යූපීඑස්, ඡායා පිටපත් යන්ත්‍ර, අනෙකුත් පරිගණක උපාංග.

විදුලි සහ විද්‍යුත් උපාංග

වායු සමීකරණ යන්ත්‍ර, KDK විදුලි පංකා, ඩිජිටල් කැමරා (නිශ්චල,විඩියෝ) සහ දීප්තිමත් ආලෝක බල්බ, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ තිර, ගෘහස්ථ හා එළිමහන් ස්පීකර, ඕඩියෝ ඇම්ප්ලිෆයර, මික්සර් සහ මයික්‍රොෆෝන, විදුලි උත්පාදක යන්ත්‍ර, ප්‍රවේශ පාලන පද්ධති, CCTV පද්ධති, ඇඟිලි සලකුණු යන්ත්‍ර, විදුලි පහන් (CFL, ෆ්ලොරසන්ට්) සහ හදිසි අවස්ථා ලාම්පු, දුරකථන, විදුලි රැහැන් ඇදීමේ උපාංග, අනෙකුත් විදුලි උපාංග.



අපේ නිෂ්පාදන කළඹ



වේගයෙන් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ

ගෙදර දොර සෞඛ්‍ය පවත්වා ගැනීමට අවශ්‍ය නිෂ්පාදන, පුද්ගල සනීපාරක්ෂක භාණ්ඩ සහ ආහාර වර්ග.

ටයර් සහ වාහන බැටරි

EXIDE
APOLLO DUNLOP PIRELLI
YOKOHAMA NANKANG








කෘෂිකර්ම උපකරණ, යන්ත්‍රෝපකරණ මෙවලම් සහ ලෝහ භාණ්ඩ

කුටු කම්බි, පඳුරු කපන යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර, වෑද්දුම් ට්‍රාන්ස්ෆෝමර, කැති සහ පිහි, සියලු වර්ගයේ බල මෙවලම්, සියලු වර්ගයේ අත් මෙවලම්, ජල පොම්ප, ආරක්ෂිත උපකරණ (හිස් ආවරණ, අත්වැසුම් සහ බූට් වර්ග), මුල්ලු, අලවංගු, සවල් සහ රේක්ක, පොලිතින් සීලර්, ධූමන යන්ත්‍ර.

අපේ නිෂ්පාදන කළඹ





අභ්‍යන්තර සැලසුම් නිර්මාණ සහ කාර්යාල ගෘහ භාණ්ඩ

වානේ ගෘහ භාණ්ඩ, (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක) දැව ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක) මෙලමයින් ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක)

රසායන ද්‍රව්‍ය

කර්මාන්ත රසායන ද්‍රව්‍ය, පරීක්ෂණාගාර රසායන ද්‍රව්‍ය, විශේෂ රසායන ද්‍රව්‍ය, තෝරා ගත් පුපුරණ රසායන ද්‍රව්‍ය






තීරු බදු රහිත සාප්පුව


විදේශිකයින් සඳහා අවශ්‍ය පහසුකම් සපයයි.

ව්‍යාපාර සමාලෝචනය

විකුණුම් වර්ධනය (රු. මිලියන)



ආදයම් බදුවලට පසු ශුද්ධ ලාභය (රු. මිලියන)



රැකියා උත්පාදනය

2018 - 2023

2018/2019 සිට 2022/2023 දක්වා රැකියා උත්පාදනය

2018 - 2019



මුළු සේවකයන් 436

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **204**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **232**

2019 - 2020



මුළු සේවකයන් 398

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **211**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **187**

2020 - 2021



මුළු සේවකයන් 374

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **169**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **205**

2021 - 2022



මුළු සේවකයන් 392

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **185**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **207**

2022 - 2023



මුළු සේවකයන් 336

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **154**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **182**

ආයතනික පාලනය

පාලන ව්‍යුහය සහ යහපත් ව්‍යාපාරික පරිචයන් යළි පණගැන්වීමට පසුගිය වසර තුළ කළමනාකාරිත්වය ප්‍රයත්න දරන ලදී. ඊට අමතරව, සංස්ථාව සතුව වෙනම විගණන අංශයක් ඇති අතර මනා පාලන පරිසරයක් සහතික කිරීම පිණිස අභ්‍යන්තර පාලන ස්ථාපිත කර තිබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන වෙනම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබේ. රජයේ ප්‍රසම්පාදන පටිපාටි අනුව ප්‍රසම්පාදන යාන්ත්‍රණය අධීක්ෂණය සහ පාලනය පිණිස ටෙන්ඩර් මණ්ඩලයක් ස්ථාපිත කොට ඇත..

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ

- **කේ. සත්‍යකුමාර් මහතා** අධ්‍යක්ෂ
- **ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා** අධ්‍යක්ෂ
- **සී. පෙරේරා මහතා** අධ්‍යක්ෂ
- **කේ. ආර්. එස්. පෙරේරා මහතා** අධ්‍යක්ෂ
- **ජී. දහනායක මහත්මිය** අධ්‍යක්ෂ
- **ටී. ඒ. ඩී. රංජිත් මහතා** අධ්‍යක්ෂ

සභාපති / ක.අ.
යෝගා පෙරේරා මහතා
(2022.09.05 දින ඉල්ලා අස්විය)
ආසිරි වලිසුන්දර මහතා
(2022.09.05 දින සම්බන්ධ විය)

විගණන කමිටු සාමාජිකයෝ

- **ජී. දහනායක මහත්මිය** සාමාජික
- **කේ. සත්‍යකුමාර් මහතා** කමිටුවේ සභාපති
- **ඩී. ජේ. විද්‍යානච්චි මහතා** සාමාජික

- 2022/2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් එකොළහක් (11) සහ විගණන කමිටු රැස්වීම් තුනක් (3) පවත්වා ඇත.

ව්‍යාපාර කළමනාකරණ මෙවලම් පැවැතීම



1) ආයතනික සැලැස්ම 2022/2027
2) වාර්ෂික වාර්තාව 2021/2022
3) STC ප්‍රසම්පාදන පටිපාටි
4) STC ක්‍රියාකාරී සැලැස්ම
5) STC නිෂ්පාදන කළඹ
6) STC පැතිකඩ
7) STC ණයට විකුණුම් ප්‍රතිපත්තිය
8) STC තොග පාලන ප්‍රතිපත්තිය
9) STC අනුමත සේවක සංඛ්‍යාව


විශේෂ මූල්‍ය සිදුවීම්

	2022/2023 (රු. 000)	2021/2022 (රු. 000)	වෙනස% ↑/↓
මෙහෙයුම්			
පිරිවැටුම	9,416,776	8,750,243	8%
පොළී සහ බදුවලට පෙර ඉපැයුම්	383,501	487,963	-21%
බදු පෙර ලාභය	731,165	481,892	52%
බදු පසු ලාභය	532,775	429,731	24%
ශේෂ පත්‍රය			
ජංගම නොවන වත්කම්	632,397	491,822	29%
ජංගම වත්කම්	3,831,030	5,425,506	-29%
ජංගම වගකීම්	2,502,747	4,595,780	-46%
ජංගම නොවන වගකීම්	178,247	190,328	-6%
ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත	1,782,247	1,131,220	58%
මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	153,186	1,359,770	-89%
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්	92,352	1,354,036	-93%
ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	115,616	-1,619	-7241%
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	-711,081	-711,059	0.003%
කොටසක් සඳහා දත්ත			
කොටසක ඉපැයුම්	54	42	29%
කොටසක ශුද්ධ වත්කම්	178.00	113.12	58%
හිමිකම් මත ඵලය (ROE)	0.30	0.38	-21%
වත්කම් මත ඵලය (ROA)	0.10	0.10	0%
වැදගත් අනුපාත			
දළ ලාභ අනුපාතය	11%	10%	1%
ශුද්ධ ලාභ අනුපාතය	6%	5%	1%
ක්ෂණික අනුපාතය	0.94	0.85	11%
ජංගම අනුපාතය	1.53	1.18	30%
තෝලන අනුපාතය	0.07	0.14	-52%

විශේෂ මූල්‍ය සිදුවීම් ප්‍රස්ථාරික නිරූපණය


පිරිවැටුම

වර්ෂය	(රු. මිලියන)
13/14	3052
14/15	3862
15/16	2949
16/17	3749
17/18	4334
18/19	3474
19/20	2454
20/21	2677
21/22	8750
22/23	9417




බදු පූර්ව ශුද්ධ ලාභය

වර්ෂය	(රු. මිලියන)
13/14	74
14/15	11
15/16	31
16/17	61
17/18	82
18/19	-32
19/20	-125
20/21	47
21/22	482
22/23	731




මුළු වත්කම

වර්ෂය	(රු. මිලියන)
13/14	2275
14/15	3051
15/16	2694
16/17	2650
17/18	2994
18/19	2796
19/20	2493
20/21	2515
21/22	5917
22/23	4463




ශුද්ධ වත්කම


වර්ෂය	(රු. මිලියන)
13/14	686
14/15	695
15/16	707
16/17	759
17/18	820
18/19	786
19/20	651
20/21	701
21/22	1131
22/23	1782



කොටසක ඉපැයුම් (රු)




හිමිකම් මත ඵලය(රු.)



සංස්ථාවේ අංශයන්හි කාර්යසාධනය

ආදායම් උත්පාදකයන් 2022 - 2023



ආදායම් උත්පාදකයන්ගේ කාර්යසාධනය 2022/2023


අංශය	ආදායම	දළ ලාභය	දළ ලාභය%
රසායන ද්‍රව්‍ය	989,466,830	336,774,106	34%
තො.ස.තා.	358,777,332	24,780,251	7%
කාර්යාලීය සැපයුම්	372,467,640	110,702,911	30%
මෝටර් රථ ටයර් අංශය	242,593,285	32,367,653	13%
තීරු බදු රහිත සාප්පුව	19,268,522	6,009,146	31%
විද්‍යුත් සහ විදුලි උපකරණ	213,499,779	32,480,523	15%
විශේෂ ව්‍යාපෘති අංශය	105,450,290	17,868,546	17%
ගෘහ උපකරණ	400,374,661	64,927,777	16%
ඉදිකිරීම් ද්‍රව්‍ය	268,200,300	31,077,606	12%
කෘෂි යන්ත්‍රෝපකරණ හා උපකරණ	364,395,394	61,221,547	17%
බැටරි අංශය	67,982,942	13,112,918	19%
අත්‍යවශ්‍ය ආහාර	6,014,299,297	287,936,563	5%
එකතුව	**9,416,776,272**	**1,019,259,548**	**11%**

වෙළඳ අංශ කාර්යසාධනය සංසන්දනය (2021-2022 / 2022-2023)


ශේෂය	2021/2022 (රු.)		දළ ලාභය%	2022/2023 (රු.)		දළ ලාභය%	% ↑ / ↓		
	විකුණුම්	දළ ලාභය		විකුණුම්	දළ ලාභය		විකුණුම්	ද.ලා	ද.ලා%
ර.ද්‍ර	1,017,779,819	239,853,555	24%	989,466,830	336,774,106	34%	-3%	40%	10%
තො.ස.තා	809,072,989	83,291,124	10%	358,777,332	24,780,251	7%	-56%	-70%	-3%
කා.සැ.	310,308,658	74,368,095	24%	372,467,640	110,702,911	30%	20%	49%	6%
මෝටර් රථ	247,936,198	34,286,188	14%	242,593,285	32,367,653	13%	-2%	-6%	-0.5%
තී.බ.ර. සාප්පුව	47,311,627	20,346,487	43%	19,268,522	6,009,146	31%	-59%	-70%	-12%
වි.වි. උපකරණ	188,930,383	30,964,040	16%	213,499,779	32,480,523	15%	13%	5%	-1%
වි.ව.අ.	383,931,252	51,982,586	14%	105,450,290	17,868,546	17%	-73%	-66%	3%
ගෘ.උ	641,478,998	71,182,448	11%	400,374,661	64,927,777	16%	-38%	-9%	5%
ඉ.ද්‍ර	308,887,197	38,357,992	12%	268,200,300	31,077,606	12%	-13%	-19%	-1%
කෘෂි. යන්ත්‍ර හා උප.	400,136,509	57,018,170	14%	364,395,394	61,221,547	17%	-9%	7%	3%
බැටරි අංශය	65,075,722	10,738,532	17%	67,982,942	13,112,918	19%	4%	22%	3%
අත්‍යවශ්‍ය ආහාර	4,329,393,636	200,730,099	5%	6,014,299,297	287,936,563	5%	39%	43%	0.2%
එකතුව	**8,750,242,988**	**913,119,316**	**10%**	**9,416,776,272**	**1,019,259,548**	**11%**	**8%**	**12%**	**0.39%**

2021/2022 දී සහල් ආනයනය කර බෙදා හැරීම ආරම්භ කරන ලද අතර එම මෙහෙයුම් ඉහත වගුවේ අත්‍යවශ්‍ය ආහාර අංශය තුළ ඇතුලත් කර ඇත

වෙළඳ අංශයන්හි ආදායම් සංසන්දනය



වෙළඳ අංශයන්හි දළ ලාභ සංසන්දනය



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඑස්සී/සී/එස්ටීසී/එෆ්/ඒ/2022/23/10 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 ඔක්තෝබර් 04

සභාපති,

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01හි 32 ඡේදය අනුව වත්කම් හා වගකීම් හිලව් කර නොදැක්විය යුතු වුවද, වර්ෂ 2 ක සිට වර්ෂ 5 ක් දක්වා නිරවුල් නොකළ රු.15,230,311ක් වූ අත්තිකාරම් ශේෂයන් අඩුකර වෙළඳ ණයගැති ශේෂය රු.338,829,077 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණෙන් ණයගැතියන් රු.15,230,311කින් ඌණගණනය වී තිබුණි. එසේම ණයහිමියන්ගෙන් ලැබිය යුතු වටිනාකම් වූ රු.9,050,348 ක් අඩුකර වෙළඳ ණයහිමි ශේෂය වන රු.290,036,187 මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණෙන් ණයහිමියන් රු.9,050,348කින් ඌණ ගණනය වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව තොග අගය කිරීමේදී පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය පදනම් කරගත යුතු වුවත් රු.1,467,189,374ක් වූ තොග අගය කිරීමේ දී පිරිවැය පමණක් සළකා තිබූ අතර, ශුද්ධ උපලබ්ධි අගයට තොගය ගණනය කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 42 වැනි ඡේදයට අනුව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීත්‍යානුයෝගීව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කළ යුතු අතර වැරැද්ද සිදු වූ පූර්ව කාල පරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක නැවත සකස්කල අගයන් දැක්විය යුතුය. එසේම ප්‍රමිතියෙහි 49 ඡේදය අනුව වැරදි නිවැරදි කිරීම් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය. නමුත් සමාගම විසින් ප්‍රමිතියට පටහැනිව, මඩකළපුව රජවාස ව්‍යාපෘතිය සඳහා 2021/2022 මූල්‍ය වර්ෂය තුලදී ලැබුනු රාජ්‍ය ප්‍රදාන වටිනාකම වන රු.22,924,908ක් නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ වසර 3කට හෝ වසර 5කට වතාවක් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට පිරිවැය රු.226,240,000ක් වූ ඉඩම්, රු.76,650,751ක් වූ ලී බඩු උපකරණ, රු.53,311,892ක් වූ පරිගණක, රු.4,604,753ක් වූ මෙවලම් හා උපකරණ, හා රු.46,498,023ක් වූ කාර්යාල උපකරණ 2012 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුම තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළයුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහතදී කළ ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළයුතු වුවත් 2023 මාර්තු 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන

ලද රු.125,382,242ක් වූ වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 28 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ප්‍රදාන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනමම හෙළිදරව් කළයුතු වුවත් වර්ෂය තුළදී ලැබූ රු.1,379,052ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණු අතර 39 (a) ඡේදය ප්‍රකාරව රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) 2023 මාර්තු 31 දිනට අස්පෘශ්‍ය වත්කම් (පරිගණක මෘදුකාංග) වටිනාකම රු.9,330,001 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 අනුව, අස්පෘශ්‍ය වත්කම් (Intangible Assets) හඳුනාගැනීමේ පදනම, ප්‍රයෝජනවත් ජීවිත කාලය, හාවිතාකරන ක්‍රමක්ෂය අනුපාතය ආදි තොරතුරු ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 (SLFRS 07) අනුව වගකීම් සඳහා ඇපයට තබා ඇති වත්කම් (assets pledged as collateral) මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවද සමාගම විසින් බැංකු පහසුකම් (Banking Facility) ලබා ගැනීම සඳහා ඇපයට තබා ඇති මහජන බැංකුවේ රු.1,008,700,000ක් වූ ස්ථාවර තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) 2023 මාර්තු 31 දිනට පැවති රු.42,167,379ක් වූ තොග අඩුමාන හා රු.9,689,479ක් වූ තොග අධිමාන ගිණුම්වලින් වෙනමම හෙළිදරව් නොකර විකුණුම් පිරිවැය යටතේ දක්වා තිබුණි. දීර්ඝකාලින වශයෙන් සිදුවන මෙම තොග හානි පෙර වර්ෂය හා සැසඳීමේ දී සියයට 262 කින් ඉහළ ගොස් තිබුණි.

(ඔ) ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය ගිණුම්ගත කිරීමේදී රඳවාගැනීමේ බදු අඩුකල පසු වටිනාකම ගිණුම්ගත කල යුතු වුවත් සමාගම විසින් මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවල රඳවාගැනීමේ බදු අඩුකිරීමට පෙර පොළී වටිනාකම වන පිළිවෙලින් රු.174,159,655ක් හා රු.35,961,370ක් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය ලෙස සටහන් කර තිබුණි. එබැවින් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු.10,506,051කින් අධි ගණනය වී තිබුණු අතර, ලැබිය යුතු රඳවාගැනීමේ බදු රු.10,506,051කින් ඌණගණනය වී තිබුණි.

(ඕ) මූල්‍ය ප්‍රකාශන අනුව 2023 මාර්තු 31 දිනට ගෙවිය යුතු එකතුකළ අගය මත බදු වටිනාකම රු.2,909,027ක් වූ අතර එකතුකළ අගයමත බදු ප්‍රේෂණ පත්‍ර අනුව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.12,486,683ක් 2023 අප්‍රේල් 20 දින ගෙවා තිබුණි. එබැවින් ප්‍රතිපාදන වෙන්

කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවීම් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල බදු වියදම හා ගෙවිය යුතු එකතුකල අගය මත බදු වටිනාකම රු.9,577,656කින් ඌණ ගණනය වී තිබුණි.

(ක) මඩකළපුව ප්‍රදර්ශනාගාරය සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ගෙවිය යුතු කුලී වටිනාකම රු.87,500ක් වුවද, සමාගම විසින් 2022 සැප්තැම්බර් 01 දින සිට 2024 අගෝස්තු 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා මුළු කුලී වටිනාකම රු.300,000ක් අත්තිකාරම් ගිණුම හර ලෙස හා උපචිත කුලී ගිණුම බැර ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. එම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් වටිනාකම රු.300,000කින් හා උපචිත කුලී රු.212,500කින් අධිගණනය වන අතර කුලී වියදම් රු.87,500කින් ඌණ ගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා, දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ (ඉ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	නිල වාහන සඳහා හිමිකම නොමැති ස්ථිර පදනම්න් බඳවාගත් නිලධාරීන් 41 දෙනෙකුට මාසික ප්‍රවාහන දීමනා ලෙස රු.2,952,500ක මුදලක්ද කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබූ නිලධාරීන් 10 දෙනෙකුට රු.1,160,000ක මුදලක්ද ගෙවා තිබුණි.
(ආ)2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 වගන්තිය	ආයතනයේ සියළුම මිලදී ගැනීම් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවත්, සමාගම විසින් වෙළඳ තොගය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණ අතර ස්ථාවර වත්කම් මිලදී ගැනීම සම්බන්ධයෙන් පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2023 මාර්තු 31 දිනට ගබඩාවේ පවතින පිරිවැය රු.529,846,414ක් වූ තොගයෙහි ඇතුලත් වර්ෂ 1, 2, 3, 4, සහ 5ට වැඩි කාලයක් ගබඩාවෙහි පැවති තොගවල වටිනාකම පිළිවෙළින් රු.39,190,210ක්, රු.7,251,928ක්, රු.3,722,072ක්, රු.6,035,062ක් සහ රු.89,113,082ක් විය. ඉහත තොගයෙහි ඇතුළත් පළුදු වූ අයිතම ලෙස හඳුනාගෙන තිබූ රු.9,511,044 ක් වූ තොග ඉවත් කිරීම සම්බන්ධයෙන් සමාගම් කටයුතු කර නොතිබුණි. තවද, තොග කල් ඉකුත් වූ හෝ කල් ඉකුත් වීමට ආසන්න තොගයන් සත්‍යාපනය කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රමවේදයක් හෝ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කර නොතිබුණි.

(ආ) සමාගම විසින් 2015 වර්ෂයේ දී වී තොග රැස් කිරීම සඳහා ජංගම ගබඩා (Cocoon) 50 ක් පිරිවැය රු.107,388,160කට පිලිපින රජයෙන් ආනයනය කර තිබූ අතර එම තොගයෙන් ඒකක 15 ක් පමණක් වී අලෙවි මණ්ඩලයට රු.35,432,450 ක මුදලකට අලෙවිකර තිබූ අතර, ඒකක 13 ක් CSR ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය ආයතන 4කට බෙදා දී තිබුණි. ඉතිරි තොගය වූ පිරිවැය රු.47,250,790ක් වූ ඒකක 22ක් වර්ෂ 8ක සිට නොවිකිණී ගබඩාවේ රඳවා තිබුණි.

(ඇ) 2020 වර්ෂයේ නොවැම්බර් සිට 2022 මාර්තු දක්වා Q Shop අලෙවිසැල් 09 ක ආරම්භ කර තිබුණු අතර 2020/2021 වර්ෂයේදී අලෙවිසැල් 02 ක් හා 2022/2023 වර්ෂයේදී වෙළඳසැල් 09 ක් ක්‍රියාකාරී මට්ටමේ පැවතුණි. එම අලෙවිසැල්වල 2020/2021 හා 2021/2022 වර්ෂයන්හි මුළු ක්‍රියාකාරී ලාභය පිළිවෙලින් රු.1,335,844 ක් හා රු.2,163,344 ක් වූ අතර 2022/2023 වර්ෂයේ මුළු ක්‍රියාකාරී අලාභය රු.10,043,972 ක් විය. එම හේතුවෙන් Q Shop අලෙවිසැල් ආරම්භකිරීම තුළින් සමාගමේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද, Q Shop අලෙවිසැල්වල භදුනාගන්නා ලද වටිනාකම රු.6,209,741ක් වූ (විකුණුම් මිලට) කල් ඉකුත් වූ සහ පළුදු වූ භාණ්ඩ නාරාහේන්පිට ගබඩාවෙහි පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර එම භාණ්ඩ ගබඩාවෙන් ඉවත්කිරීම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

(ඈ) Q Shop අලෙවිසැල් දිගින් දිගටම අලාභ ලැබීම හේතුවෙන් 2023 වර්ෂයේදී මෙම අලෙවිසැල්හි මෙහෙයුම් කටයුතු නතර කිරීමට තීරණය කර තිබූ අතර, 2023 මාර්තු 28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව අලෙවිසැල් 08ක් වසර 05ක කාල සීමාවකට මාසිකව රු.575,000ක කුලී මුදලකට කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයට ලබා දීමට 2023 මැයි 26 දින ගිවිසුම්ගත වී තිබුණද, 2023 අගෝස්තු 31 දිනවන විට අලෙවිසැල් 04 ක් පමණක් මණ්ඩලය වෙත භාර දී තිබුණි.

(ඉ) සමාගම විසින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් කුලී පදනම මත ලබාගෙන තිබුණු වේයන්ගොඩ ගබඩාවෙහි ගිවිසුම් කාලපරිච්ඡේදය 2023 පෙබරවාරි මස අවසන් වීමෙන් පසුව මාස 6 ක කාලසීමාවක් තුල භාණ්ඩ ගබඩා කිරීමකින් තොරව නිෂ්කාර්යව පවත්වාගෙන ගියද, ගිවිසුම් අළුත්කර ගැනීමක් හෝ ගබඩාව ආපසු භාරදීමට ක්‍රියා නොකිරීම හේතුවෙන් මාසික කුලිය රු.210,000 ක් බැගින් මාස 06 සඳහා රු.1,260,000ක් ආහාර දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.1,053,318,795ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2012 වර්ෂයෙන් පසුව භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

(උ) අත්තිකාරම් අඩුකිරීමට පෙර ණයගැති වටිනාකම් වන රු.726,761,316 තුල වර්ෂ 2, 3, 4, 5 සහ 5ට වැඩි කාල පරාසයක් තුල අයකර නොගත් ණයගැති ශේෂ වල වටිනාකම් පිළිවෙලින් රු.29,055,601ක් රු.4,207,863ක් රු.9,215,669ක් රු.17,378,652ක් සහ රු.166,098,488ක් විය. වසර 5ට වැඩි ණයගැති ශේෂය වන රු.166,098,488 ක් තුල වසර 08 ක කාලයක සිට රාජ්‍ය ආයතනයන් 06කින් අයවිය යුතු ණයගැති ශේෂය රු.104,387,590 ක් ශේෂ තහවුරු කර ගැනීමකින් තොරව ගිණුම් වලින් ඉවත්කර තිබුණි.

(ඌ) වෙනත් ලැබිය යුතු වටිනාකම් රු.425,033,261 ක් තුල ඇතුලත් වර්ෂ 4කට වැඩි කාලයක සිට අයකර නොගත් ලැබිය යුතු ශේෂය රු.15,180,560ක් විය.

(එ) ණය හිමි ශේෂය වන රු.290,036,187 තුල පිළිවෙලින් වර්ෂ 4 සහ 5ට වැඩි කාල පරාසයක් තුල නිරවුල් නොකල ණය ශේෂ වල වටිනාකම් පිළිවෙලින් රු.39,056,445ක් හා රු.51,465,657ක් විය. තවද දීර්ඝකාලීන වශයෙන් නිරවුල් නොකල ගෙවිය යුතු ශේෂ වටිනාකම් රු.205,743,565ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 2022/2023 වර්ෂ වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුල ක්‍රියාකාරකම් 11 ක් හඳුනාගෙන තිබූ අතර ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාව අනුව ක්‍රියාකාරකම් 5 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. මුළු ව්‍යාපෘති සමග සැසඳීමේදී ඉටු නොකල ව්‍යාපෘති සංඛ්‍යාව සියයට 45ක් වන අතර එම ව්‍යාපෘති අතර සුවිශේෂී වැදගත්කමකින් යුතු ERP ව්‍යාපෘතිය හා අපනයන වෙළඳපළට පිවිසීමට කටයුතු කිරීමද විය.

(ඔ) ක්‍රියාකාරී සැලැස්ම තුල අලෙවි ප්‍රවර්ධනය උදෙසා විවිධ අලෙවි/නිෂ්පාදන මාර්ග (New Product Line) 8ක් වර්ෂය තුළ හඳුන්වාදීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එවැනි අලෙවි/නිෂ්පාදන මාර්ග 3ක් පමණක් හඳුන්වා දී තිබුණි.

(ඕ) 2022/2023 වර්ෂයට පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ආවරණය කල යුතු විගණන ක්ෂේත්‍ර 06ක් හඳුනාගෙන තිබුණද, ඉදිරිපත් කරන වාර්තා අනුව තොග සමීක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි අවධානය යොමුකර තිබුණ අතර අනෙක් ක්ෂේත්‍ර ප්‍රමාණවත් ලෙස ආවරණය කර නොතිබුණි. තවද මෙම තොග සමීක්ෂණයන්හිදී දිගින් දිගටම සිදුවන තොග හානි තත්ත්වයන් අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ක) ආයතනයේ ගිණුම්කරණ පද්ධතිය නවීකරණය කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක රු.1,805,000ක අත්තිකාරමක් ලබාදී තිබූ අතර එම අත්තිකාරම් ලබාදී වර්ෂ 05ක් ගතවී තිබුණද ගිණුම්කරණ පද්ධතිය නවීකරණය කිරීම හෝ අත්තිකාරම් පියවා ගැනීම සිදුකර නොතිබුණි..

(ග) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ණයගැතියන් සඳහා වන හානිකරණ අලාභය රු. 1,211,418 සිට රු. 105,281,937 දක්වා රු.104,070,519ක් හෙවත් සියයට 99කින් ඉහළ ගොස් තිබුණි.

(ච) 2023 ජනවාරි 11 දිනැති අංක 23/0038/627/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව දේශීය වෙළඳපලේ පවතින බිත්තර හිඟයට කෙටිකාලීන විසඳුමක් ලෙස බිත්තර ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2023 මාර්තු මාසයේ සිට මැයි දක්වා බිත්තර 16,531,200 ක් ආනයනය කිරීමේදී බිත්තර ආනයනයෙන් පසු තාවකාලික ගබඩා මධ්‍යස්ථානය වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර Immortal සමාගම තෝරාගෙන ඇති අතර එම සමාගම විසින් Spectra Yard ආයතනයෙන් සේවාව ලබාගෙන සමාගම වෙත සේවාව සපයා තිබුණි. පසුව සමාගම විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර Spectra Yard ආයතනය මඟින් සේවාව ලබා ගෙන රු.7,053,250ක් ගබඩා කුලී වශයෙන් ගෙවා තිබුණි.

(ට) අමප/20/1698/313/029 හා 2020 නොවැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සමාගම විසින් ආරම්භ කරන ලද රජවාස වෙළෙඳ සංකීර්ණයේ ආරම්භක දින වන 2021 මාර්තු 15 සිට විගණිත දිනය වන 2023 ජූනි 30 දින දක්වා ලැබූ ශුද්ධ අලාභය රු.6,743,948 ක් විය. මෙම කාලපරිච්ඡේදයට අදාල මුළු කුලී ආදායම රු.31,222,146ක් වූ අතර මුදලින් ලැබීම් හා කුලී නැන්පතු වලින් පියවා ගැනීමෙන් අනතුරුව 2023 ජූලි 31 දිනට අයවියයුතු වටිනාකම රු.1,369,750ක් විය. තවද බදු ගිවිසුම් ප්‍රකාරව මාසික විදුලි බිල්පත්, ජල බිල්පත් හා දුරකථන බිල්පත් දෙවන පාර්ශවය විසින් දැරියයුතු බව දක්වා තිබුණද උක්ත කාලපරිච්ඡේදයට අදාල විදුලි වියදම් වූ රු. 12,947,529ක මුදල් සමාගම විසින් දරා තිබුණි.

(ඩ) 2023 මාර්තු 31 දිනට සමාගමේ මුළු අනුමත කාර්ය මණ්ඩලය 320 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 328 වූයෙන් එදිනට පුරප්පාඩු 45 ක් හා අතිරික්ත 53 ක් පැවතුණි. මෙම පුරප්පාඩු තනතුරු 45 ඇතුලත විධායක මට්ටමේ පුරප්පාඩු 24ක් හා සහාය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් පැවතිණි. තවද තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිළධාරීන් 51 දෙනෙකු සහ ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුව නැවත කාලය දීර්ඝ කිරීමෙන් තොරව රඳවාගෙන ඇති අනියම් පදනම මත බඳවාගත් නිලධාරීන් 44 දෙනෙකු විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2023 මාර්තු 31න් අවසන් වසර සඳහා

	සටහන්	2022 / 2023 රු.	2021 / 2022 රු.
ආදායම	03	9,416,776,271	8,750,242,988
විකුණුම් පිරිවැය		(8,397,516,723)	(7,837,123,672)
දළ ලාභය		1,019,259,548	913,119,316
අනෙකුත් මෙහෙයුම් ආදායම / (වියදම)	04	35,297,453	68,551,847
		1,054,557,002	**981,671,163**
බෙදා හැරීමේ වියදම්	05	233,327,415	83,825,722
පරිපාලන වියදම්	06	433,457,185	419,056,526
		666,784,600	**502,882,248**
පොළී සහ බදුවලට පෙර ඉපැයුම්		**387,772,401**	**478,788,916**
ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	07	347,663,542	(6,071,005)
බදුකරණයට පෙර ලාභය/(අලාභය)		**735,435,943**	**472,717,911**
බදුකරණය	08	(199,671,153)	(49,959,186)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)		**535,764,790**	**422,758,725**
අනෙකුත් විස්තීරණ ආදායම			
සේවක ප්‍රතිලාභ මත ලාභ/(අලාභ)		(4,271,080)	9,174,235
අනෙකුත් විස්තීරණ ආදායම මත බදු		1,281,324	(2,201,817)
අනෙකුත් විස්තීරණ ආදායම (අලාභ) - බදු අයකල පසු	-	**(2,989,756)**	**6,972,419**
වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම (අලාභ) - බදු අයකළ පසු		**532,775,034**	**429,731,144**
කොටසක් සඳහා මූලික ඉපැයුම්	09	54	42

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

2023 මාර්තු 31න් අවසන් වසර සඳහා

වත්කම්	සටහන්	2022 / 2023 රු.	2021 / 2022 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	566,611,360	466,200,401
අස්පෘශ්‍ය වත්කම්	10a	9,330,001	1
කොටස් වල ආයෝජන	11	20	20
සේවකයන්ට ලබා දුන් ණය	12A	15,422,666	11,971,618
පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමය - ජංගම නොවන	12B	-	-
ශුද්ධ විලම්බිත බදු වත්කම	17	41,032,830	13,649,744
මුළු ජංගම නොවන වත්කම්		**632,396,876**	**491,821,785**
ජංගම වත්කම්			
තොග	13	1,467,189,374	1,497,967,033
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	14	648,176,634	2,358,849,700
සේවකයන්ට ලබා දුන් ණය - වත්මන් කල් පිරීම	12A	6,991,454	5,875,877
පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමය	12B	-	9,229
ස්ථාවර තැන්පතුවල කෙටිකාලීන ආයෝජන		1,668,700,000	626,565,159
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව		25,266,927	364,276,347
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - ජා.ස. බැංකුව		1,231,400	2,473,211
මුදල් හා මුදලට සමාන දෑ	15	13,474,352	569,489,844
මුළු ජංගම වත්කම්		**3,831,030,142**	**5,425,506,400**
මුළු වත්කම්		**4,463,427,000**	**5,917,328,166**

ස්කන්ධය සහ වගකීම		2022 / 2023 රු.	2021 / 2022 රු.
ප්‍රාග්ධන සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.10 සාමාන්‍ය කොටස් මිලියන 10)		100,000,000	100,000,000
පොදු සංචිත		45,607,646	45,607,646
ප්‍රත්‍යාගණන සංචිත		354,808,198	241,108,234
අනෙකුත් සංචිත		(30,210,013)	(27,220,257)
රඳවාගත් ඉපැයුම්		1,312,041,000	771,724,662
මුළු ස්කන්ධ		**1,782,246,831**	**1,131,220,285**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	16	34,243,718	39,164,924
රජයේ ප්‍රදාන සහ විලම්බිත ආදායම් ගිණුම	21	144,189,502	151,163,223
දිගුකාලීන ණය ගැනුම්	18	-	-
මුළු ජංගම නොවන වගකීම්		**178,433,220**	**190,328,148**
ජංගම වගකීම්			
කෙටිකාලීන ණය ගැනුම්	18	13,600,000	-
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	19	2,383,206,991	4,436,757,832
බැංකු අයිරා	20	105,939,957	159,021,901
මුළු ජංගම වගකීම්		**2,502,746,947**	**4,595,779,734**
මුළු ස්කන්ධ සහ වගකීම්		**4,463,427,000**	**5,917,328,166**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි මූලික කොටස් බව සලකන්න. (වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා සමඟ අනුකූල වේ.

.....
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී.

.....
සභාපති

.....
අධ්‍යක්ෂ

28.06.2023
.....
දිනය

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2023 මාර්තු 31න් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	පොදු සංචිත රු.	අනෙකුත් සංචිත රු.	රඳවාගත් ලාභය/අලාභය රු.	එකතුව රු.
2021 අප්‍රේල් 1 වැනි දිනට ශේෂය	100,000,000	241,108,234	45,607,646	(34,192,676)	348,965,937	701,489,142
වසර සඳහා ශුද්ධ ලාභය/(අලාභය)	-	-	-	-	422,758,725	422,758,725
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ)	-	-	-	6,972,419	-	6,972,419
2022 මාර්තු 31 දිනට ශේෂය	**100,000,000**	**241,108,234**	**45,607,646**	**(27,220,257)**	**771,724,662**	**1,131,220,287**
2022 අප්‍රේල් 01 දිනට ශේෂය	**100,000,000**	**241,108,234**	**45,607,646**	**(27,220,257)**	**771,724,662**	**1,131,220,286**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)	-	-	-	-	535,764,790	535,764,789
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ශුද්ධ ලාභ/(අලාභ)	-	-	-	(2,989,756)	-	(2,989,756)
පෙර වසරේ ගැලපුම්	-	-	-	-	4,551,548	4,551,548
වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය	-	113,699,964	-	-	-	113,699,964
යෝජිත ලාභාංශ (දළ)	-	-	-	-	-	-
2023 මාර්තු 31 දිනට ශේෂය	**100,000,000**	**354,808,198**	**45,607,646**	**(30,210,013)**	**1,312,041,000**	**1,782,246,830**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි මූලික කොටස් බව සලකන්න.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 මාර්තු 31න් අවසන් වසර සඳහා

	2022 / 2023 රු.	2021 / 2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	735,435,943	472,717,911
ගැලපීම්		
ක්ෂයවීම/ක්‍රමක්ෂය	47,682,310	43,781,182
පොළී ආදායම	(370,461,238)	(52,801,540)
කෙටිකාලීන ණය සහ අයිරා පොළිය	22,797,696	58,872,545
දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභය/(අලාභය)	(2,352,197)	(54,939)
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	1,326,000	1,308,000
ණයගැති හානිය	105,281,937	1,211,418
තොග හානිය	(17,209,276)	(9,730,290)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	6,623,591	7,979,707
ප්‍රත්‍යාගණන අතිරික්තය	(113,699,977)	-
පෙර වසරේ ගැලපුම්	4,551,548	-
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**419,976,338**	**523,283,993**
තොග භාණ්ඩ (වැඩිවීම)/ අඩුවීම	47,986,935	(1,055,176,914)
වෙළඳ ණයගැතියන් (වැඩිවීම)/අඩුවීම	711,094,235	(1,735,736,778)
රජයේ ප්‍රදාන විලම්භිත ආදායම (වැඩිවීම)/ අඩුවීම	(1,205,100)	11,770,585
ලැබිය යුතු ආනයනිත සහල් මිල සහනාධාරය (වැඩිවීම)/අඩුවීම	1,209,838,823	-
පහසු ගෙවීම් ණය යෝජනා ක්‍රමයේ (වැඩිවීම)/ අඩුවීම	(19,788)	541,161
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	(2,234,485,838)	3,615,088,211
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්	**153,185,604**	**1,359,770,258**
ගෙවනු ලැබූ රඳවාගැනීමේ බද්ද	(1,655,756)	-
ගෙවනු ලැබූ ආදායම් බද්ද	(43,182,162)	-
ගෙවනු ලැබූ පාරිතෝෂික	(15,815,878)	(5,734,470)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලදී යොදාගත් ශුද්ධ මුදල්	**92,531,809**	**1,354,035,788**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත හා උපකරණ අත්කරගැනීම	(3,176,535)	(55,615,946)
අයෝජන - නොනිමි වැඩ	(34,766,180)	-
බැහැරකිරීම්වලින් ලත් මුදල්	100,000	70,067
කෙටිකාලීන ආයෝජනවලින් ලැබුණු පොළිය	153,458,665	53,926,735
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්	**115,615,950**	**(1,619,144)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
ස්ථාවර තැන්පතුවල ආයෝජන	(1,042,134,841)	(36,711,218)
කෙටි කාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව	339,009,420	(41,156,849)
කෙටි කාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - ජා.ස. බැංකුව	1,241,811	(1,858,668)
ශුද්ධ ණය ආපසු ගෙවීම් සහ උත්පාදන	13,600,000	(572,459,623)
ගෙවන ලද කෙටි කාලීන ණය සහ අයිරා පොළිය	(22,797,696)	(58,872,545)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**(711,081,307)**	**(711,058,903)**
මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(502,933,548)	641,357,741
වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ	410,467,943	(230,889,798)
වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ - (සටහන අ)	**(92,465,605)**	**410,467,943**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

සටහන අ - මුදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය	31.03.2023 දිනට රු.	31.03.2022 දිනට රු.
බැංකුවේ ඇති මුදල්		
ලංකා බැංකුව (ගිණුම් අංක 8859546)	270,158	270,158
සම්පත් බැංකුව (ගිණුම් අංක 000930000337)	1,354,218	4,245,877
ලංකා බැංකුව (ගිණුම් අංක 1060)	93,358	73,940,432
මහජන බැංකුව - කුරුණෑගල	1,015,315	-
මහජන බැංකුව - මාතර	1,006,750	1,043,286
මහජන බැංකුව - මහනුවර	1,312,850	1,277,555
මහජන බැංකුව - පොළොන්නරුව	-	382
මහජන බැංකුව - කල්මුණේ	1,000,000	872,305
ජා.ස.බැ. (ගිණුම් අංකය - 101000160408)	478,506	505,927
මහජන බැංකුව - සහල් 180	614,901	467,503,401
මහජන බැංකුව - සහල් 004 1 0027 0206579	81,951	-
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	25,474	-
අතැති මුදල්		
සුළු මුදල් අග්‍රිමය	873,019	624,779
අතැති මුදල්	5,216,191	19,205,743
බැංකු අයිරා		
සම්පත් බැංකුව - DFS (ගිණුම් අංකය - 002930006974)	131,660	(23,721,292)
මහජන බැංකුව - (ගිණුම් අංකය 004100120210918)	(105,939,957)	(135,154,900)
මහජන බැංකුව - කුරුණෑගල	-	(145,709)
	(92,465,605)	**410,467,943**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

1. පොදු විස්තරය

සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කොට ඇත.

මෙහි ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය අංක 100, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබයි.

ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය මෙහෙයුම් වෙළඳාම හා ප්‍රතිසම්පාදන කටයුතු වන අතර රාජ්‍ය අංශයේ ප්‍රධාන සැපයුම්කරුවෙකු ලෙස ද ආයතනය ක්‍රියා කරනු ලබයි.

2023 මාර්තු 31 වන දිනට ආයතනික ශ්‍රම බලකාය 336 කි. (2021/2022- 392)

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

2.1 පිළියෙළ කිරීමේ පදනම

2.1.1 අනුගතවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නව ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියාමයන්ට අනුකූල වන අයුරින් සකස් කොට ඉදිරිපත් කර ඇත.

2.1.2 ඉදිරිපත් කිරීමේ පදනම

පහත දැක්වෙන අයිතමයන් හැර අනෙකුත් සියළුම අයිතම ගෙනහැර දක්වා ඇත්තේ "චෛතිහාසික පිරිවැය පදනම" පදනම් කර ගනිමිනි.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව, විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම වර්ථමාන අගයට පෙන්වා ඇත්තේ ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය පදනම් කර ගනිමිනි.

ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම් කටයුතු අධීක්ෂණයෙන් පසුව ආයතනයේ කටයුතු අනාගත කාල පරිච්ඡේදයක් සඳහා කරගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතු බව තහවුරු කර ඇත. එම නිසා අඛණ්ඩ පැවැත්ම නැමති සංකල්පය මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

2.1.3 සංසන්දනාත්මක විශ්ලේෂණය

පසුගිය වසර වල මූල්‍ය ප්‍රකාශන වල අදාල ශේෂයන් ජංගම වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලින් සනාථ කිරීම සඳහා අවශ්‍ය විටදී නැවත වර්ගීකරණය කොට දක්වා ඇත.

2.1.4 ඇස්තමේන්තු සහ තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතයට ගෙන ඇති අතර මෙමගින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් කෙරෙහි සෘජු බලපෑමක් ඇති අවස්ථාවන්හි දී ප්‍රකාශයට පත් කරන ප්‍රකාශන සැබෑ තත්වයට වෙනස් විය හැකිය.

මෙම ඇස්තමේන්තු සහ උපකල්පන වාර්ෂිකව කළමණාකාරිත්වයේ සමාලෝචනයට පත්වන අතර එම අවස්ථාවන්හි දී ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදුකරන ලද ප්‍රතිශෝධන අදාල ගිණුම් වර්ෂයේ හදුනා ගැනීම සහ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම සහ ඉදිරි ගිණුම් වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවලට ගනු ලබයි.
සටහන් අංක 16 - ගිණුම් කිරීමේ නිශ්චිත විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම.

මූල්‍ය ප්‍රකාශන සඳහා බලපාන උද්ධමනකාරී සාධක වලට ගැලපීම් සිදු කර නොමැත.
වැදගත් සහ සුදුසු ප්‍රතිපත්තීන් ඉදිරි සටහන්වල ඉදිරිපත් කර ඇත.

2.1.5 විදේශීය මුදල් ගණුදෙනු පරිවර්තනය

(අ) ඉදිරිපත් කොට භාවිතයේ ඇති සහ ක්‍රියාකාරී මුදල් ඒකකය

විදේශ මුදල් ගණුදෙනු ගිණුම්ගත කිරීමේ දී අදාල ගණුදෙනුව සිදු වූ දිනට පැවති විදේශීය හුවමාරු අනුපාතය පදනම් කර ගනු ලබයි. අදාල ගණුදෙනු පියවීමේ දී ඇති වූ ලාභ හෝ අලාභ පරිවර්තනය කර ඇත්තේ වසර අවසානයේ පැවති හුවමාරු අනුපාතයන්ට අනුවයි. ආයතනයේ ගිණුම් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. මෙය ශ්‍රී ලංකාව තුල ක්‍රියාකාරිත්වය දරණ මුදල් ඒකකය වේ.

(ආ) ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී අදාල දිනට පැවති විනිමය අනුපාතය අනුව ගලපා ගිණුම්වල දක්වා ඇත.

2.2 වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම

2.2.1 දේපල, පිරියත සහ උපකරණ

2.2.2 හඳුනා ගැනීම සහ මිනුම් කිරීම

ආයතනය විසින් ගොඩනගා ගත් වත්කම්වල අගය පෙන්වා ඇත්තේ ඒ වෙනුවෙන් දරන ලද අමු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ දරන ලද අනෙකුත් සෘජු වියදම් ද ඇතුලත්ව එම වත්කම් භාවිතයට ගත හැකි වන ආකාරයට පත් කර ගැනීමට දැරූ සියලු පිරිවැය ඇතුලත් අගයට වේ.

කිසියම් දේපල, පිරියත හා උපකරණ වර්ෂ කිහිපයක දී මිලට ගත් වත්කම් නම් එහි ඵලදායී ජීව කාලය බෙදා දැක්වීම කළ යුත්තේ ප්‍රධාන සංඝටකවල පැවැත්ම පදනම් කර ගනිමිනි.

දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය අගය අඩුකළ පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක් සිදු වුව හොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්ෂය අගය අඩු කිරීමෙන් අනතුරුව එය ගෙන හැර දැක්වේ. එම ක්ෂය කල අගය අඩු කර නොහැකි අවස්ථාවල දී එම වත්කම මත වූ ක්ෂය ලියා හැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල, එසේ නැත්නම් පිරියත, උපකරණ පොත් අගය ලෙස ගෙන හැර දක්වනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය අගය අඩු කළ පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක් සිදු වුවහොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්ෂය අගය අඩු කිරීමෙන් අනතුරුව එය ගෙනහැර දැක්වේ. එම ක්ෂය කළ අගය අඩු කළ නොහැකි අවස්ථාවල දී එම වත්කම මත වූ ක්ෂය ලියා හැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල එසේත් නැත්නම් පිරියත උපකරණ පොත් අගය ලෙස ගෙනහැර දක්වනු ලැබේ.

2006 වසරේ සිදු කරන ලද ප්‍රත්‍යාගණනය මත පදනම්ව ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් ගත කරනු ලබයි. ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එය 2023/2024 මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කරනු ඇත.

ආයතනය සතු ඉඩම් සාධාරණ අගය අනුව ගෙනහැර දක්වනු ලබන අතර ඒ සඳහා වාර්ෂිකව සමුච්චිත ක්ෂය අගයක් සටහන් කරනු නොලැබේ. ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමේ දී එහි අගයේ වැඩි වීමක් සිදු වී නම් ආදායම් ප්‍රකාශයේ දක්වනු ලබන අතර එය හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිතයෙහි දැක්වේ. අගය අඩු වීම ද මෙයට ප්‍රතිවිරුද්ධ අයුරින් මෙලෙස සටහන් කරනු ලබයි.

පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණනය ආරම්භ කරනු ලැබ ඇති අතර එය 2023/2024 මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කරනු ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

2.2.3 පසුව සිදුවූ පිරිවැය

දේපල, පිරියත හා උපකරණයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද පිරිවැය හේතුවෙන් එහි ඵලදායී ජීව කාලය වැඩි වන්නේ නම්, එහි අගය ගණනය කළ හැකි නම් එවැන්නක් ගිණුම්ගත කරනු ලබන අතර එය ප්‍රාග්ධන වියදමක් ලෙස ගෙනහැර දැක්වේ. දේපල, පිරියත හා උපකරණ දෛනික භාවිතයේ දී සිදුවන වියදම් ගෙන දක්වනු ලබන්නේ ආයතනයේ ආදායම් ප්‍රකාශයෙහි වේ.

2.2.4 නොහඳුනා ගැනීම

දේපල, පිරියත හා උපකරණයන්හි ධාරණ පිරිවැය හඳුනා ගන්නා අතර එම වත්කම සඳහා ආර්ථික වටිනාකමක් නොමැති අවස්ථාවන්හි දී හෝ භාවිතයෙන් ඉවත් කර ඇති විට දී එය ආයතනය විසින් බැහැර කෙරේ. එහි දී ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි දැක්වේ.

2.2.5 ක්ෂය

ආයතනයේ දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ දී එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන්නේ, "සරල මාර්ග ක්‍රමය" යටතේ පිරිවැය හෝ ප්‍රත්‍යක්ෂිත වටිනාකමෙන් සුන්බුන් අගය අඩු කර ඵලදායී ජීවිත කාලය පුරාවට බෙදා හැරීමෙනි. ලීසිං පහසුකම් යටතේ ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ ලීසිං පහසුකම් සලසනු ලබන හෝ එම වත්කමේ ජීව කාලය යන අයිතම දෙකෙන් අඩු කාල සීමාවටයි. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්මන් සහ සංසන්දනාත්මක කාල සීමාවන් සඳහා ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය සහ ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි වේ.

ගොඩනැගිලි	7.5%
රථවාහන	20%
කාර්යාල උපකරණ	10%
ගෘහ භාණ්ඩ/සවිකිරීම්	10%
පරිගණක මෙවලම්	33.33%
ප්‍රදර්ශනාගාර උපකරණ	20%
බදුකර වත්කම් මත වියදම් දැරීම	කල්බදු කාල සීමාව හෝ ගොඩනැගිලි ක්ෂය කළ හැකි කාල සීමාව යන දෙකින් වඩා අඩු කාල සීමාව.

සෑම වසරකම ක්ෂය කරනු ලබන ක්‍රමය සහ අයිතමයන්ගේ ජීව කාලය සමාලෝචනය කර කළමනාකාරිත්වය විසින් මූල්‍ය වාර්තාවල ගෙනහැර දක්වනු ලබයි.

2.2.6 අස්පෘශ්‍ය වත්කම් (ශ්‍රීලගිපු 38)

2021/2022 වසර අවසානයේදී පරිගණක මෘදුකාංග පද්ධතිය ප්‍රත්‍යාගණනය කරනු ලැබීය. මෘදුකාංග පද්ධතියේ ප්‍රයෝජනවත් අනාගත ආයු කාලය වසර 3ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. ප්‍රයෝජනවත් ආයු කාලය මත පදනම්ව, ක්ෂයවීම් අනුපාතය පහත පරිදි නිර්ණය කර ඇත.

පරිගණක මෘදුකාංග පද්ධතිය 33.33%

2.2.7 මූල්‍යමය ව්‍යුත්පන්න වත්කම් වර්ගීකරණය

ආයතනය මූල්‍යමය වත්කම් මෙසේ ගෙනහැර දක්වනු ලබයි. සාධාරණ අගය මත ලැබිය යුතු දෑ ලෙස සහ විකිණීම සඳහා කල්පිරුණු පසුව යන අයුරින් මෙම ඉදිරිපත් කිරීම සිදුවේ. කළමනාකාරිත්වය එම වත්කම් ප්‍රථමයෙන් ඉහත ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ආයතනය තුළ මෙම වර්ෂය තුල දී කිසිදු මූල්‍යමය වත්කමක් නොවීය.

2.2.8 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ මූල්‍යමය වත්කම් ලෙස දැක්වෙන අතර මෙම අයිතමවල වටිනාකම නිශ්චය කිරීමට වෙළඳපොල වටිනාකම් ගත නොහැක්කේ එය ක්‍රියාකාරී වෙළඳපොල තුළ සංසරණය නොවන බැවිනි. මෙම වත්කම් ජංගම වත්කම් වන අතර මාස 12 ට වැඩි කාලයකින් පසු කල් පිරෙන්නේ නම් ජංගම නොවන වත්කම් ගණයට අයත් වේ. ආයතනයේ ණය සහ ලැබිය යුතු දෑ, "වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ" ගෙන්ද සමන්විතයි. තවද මුදල් හා මුදල් වලට සමාන දෑ ද මෙහි පිළිඹිබු වේ.

2.2.9 මූල්‍ය මෙවලම් හිලව් කිරීම

මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කොට මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබන්නේ එහි ශුද්ධ වටිනාකම අනුව වන අතර මෙසේ සිදු කිරීමේ අරමුණ වන්නේ මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් අගයන් එකවිට හිලව් කිරීමයි.

2.2.10 මූල්‍ය වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැය මත වත්කම්

ගිණුම්කරණ වර්ෂ අවසානයේ දී ආයතනයේ මූල්‍ය වත්කම්හි අගයේ හානිකරණයක් වීද යන වග සමාලෝචනය කරනු ලබයි. මෙහි දී හානිකරණය වීමට යම්කිසි හේතුදාමයක් සිදුවිය යුතු අතර අවක්ෂේපිත සාධකද මේ සඳහා තිබිය හැකියි. මෙමගින් ආයතනයේ මූල්‍ය වත්කම්වලට හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ මුදල් ප්‍රවාහයන්හට බලපෑමක් සිදුවිය හැකි වේ.

මෙයට හේතු ලෙස ණයගැතියන්ට නැවත ගෙවීමේ නොහැකියාව, වස්තු භංගත්වය හෝ මූල්‍ය ප්‍රතිසංවිධාන කටයුතු දැක්විය හැකියි. තවද, ආර්ථික වාතාවරණය, මූල්‍ය ප්‍රවාහයන් අඩු වීම කෙරෙහි බලපෑ හැකි මූලික සාධකයක් වේ. ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ හි අලාභයන් මනිනු ලබන්නේ වත්කමේ දැන් පවත්නා අගය සහ අනාගත මුදල් ප්‍රවාහවල අගය වට්ටම් කිරීමෙන් ලැබෙන අගය ගැනීමෙනි. වත්කම් අගය අඩු වන්නේ නම් එය ආදායම් ප්‍රකාශයේ ගෙනහැර දැක්වේ.

2.2.11 අපහායනය මූල්‍ය නොවන වත්කම්

කාල නිර්ණයන් නොමැති වත්කම් ක්‍රමක්ෂය සිදු කරනු නොලබයි. නමුත් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කෙරේ. ඉහත සඳහන් වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කරනු ලබයි. එහි දී වටිනාකමේ ඇතිවන වෙනස් වීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබයි.

2.2.12 තොග

I තොග අගය කරන්නේ පිරිවැය හෝ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්ධි අගය ගණනය කරන්නේ සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන් යටතේ තොගය විකිණිය හැකි අගයෙන් පිරිවැය හා විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය. මූල්‍ය වර්ෂය සඳහා තොග සත්‍යාපනය වර්ෂ අවසානයේ සිදු කර ඇති අතර හානි වූ තොගයන් හඳුනා ගෙන ඇත. ශුද්ධ ලැබිය හැකි වටිනාකම ගිණුම්ගත කර ඇත.

වසරකට පෙර මිලදී ගනු ලැබූ තොග මුළු පිරිවැයෙන් 5% ක හානිකරණ ප්‍රතිපාදනයක් ලබා දීමෙන් පසුව ගිණුම්වලට ගෙන ඇත. වෙළඳපොළ මිල මට්ටම් පිරිවැය මිලට වඩා වැඩි බැවින් වසරක් තුළ මිලදී ගනු ලැබූ තොග පිරිවැයට ගණනය කර ඇත

II තොගයේ වටිනාකමෙන් විකුණුම් පිරිවැය ලෙස රු. 8,397,516,723 මෙම වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගෙන දක්වා ඇත.

III වෙළඳ තොගය සඳහා 5% ක අපහායන අලාභ ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇති අතර වෙළඳ තොගයේ මුල් වටිනාකම ලබා ගැනීමට ආයතනයට නොහැකි බවට සාධනීය සාක්ෂීන් ඇති විට වසරකට වඩා වැඩි තොගයන් සහ හානියට පත් තොගය සඳහා 5% අපහායන වෙන් කිරීමක් ප්‍රතිපාදනය කර ඇත.

IV පහත දැක්වෙන තොග භාණ්ඩ වටිනාකම්, ස්ථාවර තැන්පතු සහ ගොඩ නැගූ ලාභාන්තිකය, සපයනු ලැබූ ණය පහසුකම් සඳහා මූල්‍ය ආයතනවලට උගස් කර ඇත.

අ) තොග භාණ්ඩ

මූල්‍ය ආයතනයේ නම	උගස් වටිනාකම (රු.)
මහජන බැංකුව	220,490,000
සම්පත් බැංකුව	115,000,000
ජාතික සංවර්ධන බැංකුව	200,000,000

ආ) i) ස්ථාවර තැන්පතු

මූල්‍ය ආයතනයේ නම	උගස් වටිනාකම (රු.)
මහජන බැංකුව	1,008,700,000

ii) ගොඩ නැගූ ලාභාන්තිකය

මූල්‍ය ආයතනයේ නම	උගස් වටිනාකම (රු.)
මහජන බැංකුව	25,266,927.00
ජාතික සංවර්ධන බැංකුව	1,231,400.00

2.2.13 වෙළඳ ලැබිය යුතු දෑ

මෙම ලැබිය යුතු දෑ ආයතනය විසින් මූල්‍යමය වත්කමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වනු ලබන අතර ගිවිසුම් ප්‍රකාර බැඳීමක දී මුදල් හැර වෙනත් වත්කම් මගින් එය ලබා ගැනීම සඳහා ආයතනයට අයිතියක් ඇත. තවද, වසරකට වඩා වැඩි කාලයක් ගතවන විටදී වෙළඳ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

ලැබිය යුතු දෑ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කර ඇත. තවද, බොල් ණය අදාල වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ සටහන් කෙරේ. තවද, අඩමාණ ණය සඳහා වෙන් කිරීමක්ද මූල්‍ය ප්‍රකාශනවල කරනු ලබන්නේ නිශ්චිත සාධක යම් අයුරකින් ඇත්නම් පමණි. මේ සඳහා ආයතනය විසින් ප්‍රමාණාත්මක වෙන් කිරීමක් සිදු කර ඇත.

වර්ෂයකට වඩා පැරණි ණයගැතියන් සඳහා එම ශේෂය මත 5% ක හානිකරන ප්‍රතිපාදනයක් සමාගම ස්ථාපිත කරන අතර, ශ්‍රීවිසීමේ මුල් නියමයන්ට අනුව සමාගමට ගෙවිය යුතු මුළු මුදලට චකිතු කර ගත නොහැකි බව වෛෂික සාක්ෂි ඇති විට එම අයකර ගත නොහැකි මුළු ශේෂයම හානිකරන ප්‍රතිපාදන ලෙස වෙන් කරයි.

අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ ලැයිස්තු ගත කර ඇති රු. 104,387,890.21 ක් වන වසර 5කට වැඩි ණය ගැති මුදල් ප්‍රමාණ 2022/2023 වසරේ හානිකරණ ප්‍රතිපාදන ලෙස දක්වා ඇත. ලැබීමට නියමිත මුදල් ආපසු අයකර ගනු ලැබුවහොත්, අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනුරූපී ගැලපුම් සිදු කරනු ලබයි.

2.2.14 ආයෝජන

(අ) දීර්ඝ කාලීන ආයෝජන

දිගුකාලීන ආයෝජන ජංගම නොවන ආයෝජන ලෙස වර්ග කර ඇති අතර ඒවායේ අගය පිරිවැය වෙයි. ආයෝජන අත්පත් කර ගැනීමේ පිරිවැය (මිලදී ගැණුම් පිරිවැය, තැරැව් ගාස්තු, හුවමාරු ගාස්තු) ද ඇතුලත්ව මුළු පිරිවැය ගණනය කරනු ලැබේ.

(ආ) කෙටිකාලීන ආයෝජන

කෙටි කාලීන ආයෝජන ශේෂ පත්‍ර දිනට පැවති වෙළඳ අගයට හඳුනා ගනු ලබයි. කෙටිකාලීන ආයෝජනයන් හි ලාභ අලාභ ආදායම් ප්‍රකාශයට ගනු ලැබේ.

2.2.15 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලින් ගම්‍ය වන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ඉහල ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන වේ. මෙහි දී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී යොදා ගනු ලබන්නේ බැංකු අයිරාව හැර අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු පමණි.

2.2.16 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ආයතනයේ සියළුම කොටස් වල එකතුව එහි නාමික අගයෙන් වැඩි කිරීමෙන් ප්‍රකාශිත ප්‍රාග්ධනය ගණනය කොට ඇත.

මෙම ප්‍රකාශිත ප්‍රාග්ධනය පිළිබඳ හිමිකම, වගකීම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් වේ.

2.2.17 වෙළඳ ගෙවිය යුතු දෑ

සමාගම වෙළඳ ගෙවිය යුතු දෑ මූල්‍ය වගකීමක් සේ සලකනු ලබන අතර එය ශේෂ පත්‍රයේ ගෙවිය යුතු දෑ යටතේ සටහන් කරයි. මෙය සැපයුම්කරුවන් හා ඇති වූ ගණුදෙනු වල ප්‍රතිඵලයක් ලෙස ඇති වන්නා වූ මූල්‍ය වගකීමයි. සැපයුම්කරුවන්ගෙන් ලබාගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් මුදල් හෝ තවත් එවැනි වත්කම් වලින් ආයතනය ගෙවිය යුතුය. වර්ෂයකට අඩු කාලයක දී ගෙවිය යුතු නම් ඒවා ජංගම වගකීම් වන අතර වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වේ නම් ඒවා ජංගම නොවන වගකීම් ගණයට අයත් වේ. වෙළඳ ණයහිමියෝ සාධාරණ අගය මත හඳුනා ගෙන ඇත.

2.2.18 ණය

ආයතනය ගනු ලබන ණය ප්‍රතිපාදන ප්‍රථමයෙන් සාධාරණ අගය මත හඳුනා ගනු ලබයි. පසුව මෙය ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනේ. තවද, වාර්ෂිකව සිදුකරනු ලබන ගෙවීම්, ආදායම් ප්‍රකාශයේ සටහන් වන අතර එහි වගකීම වසරකට වැඩි නම් ජංගම නොවන වගකීම් ලෙසත් වසරකට අඩු නම් ජංගම වගකීමක් ලෙසත් ශේෂ පත්‍රයේ දැක්වේ.

2.2.19 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය ශ්‍රීලගිප්‍ර. 20 ප්‍රකාරව සිදු කර ඇති අතර ගිණුම් සඳහා සටහන් 21 යටතේ හෙළිදරව් කර ඇත.

2.2.20 ආදායම් බදු

(අ) වර්තමාන බදු

වර්තමාන ආදායම් බදු ගණනය කර වෙන් කොට ඇත්තේ ව්‍යාපාරයේ මෙහෙයුම් අනුව 2017 අංක 24 දරණ ආදායම් බදු පනතේ නියමයන්ට අනුකූලවය.

(ආ) විලම්භිත බදු

විලම්භිත බදු තීරණය කරනු ලැබුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා සැලකිල්ලට ගනු ලබන වත්කම් හා බැරකම් වල ප්‍රමාණය, බදු වාර්තාකරණය සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රමාණය අතර තාවකාලිකව වෙනස මත ගණනය කිරීමෙනි. විලම්භිත බදු ගණනයේදී බදු ගාස්තු හා එයට අදාල නීති භාවිතයට ගෙන ඇත.

විලම්භිත බදු වත්කම් මත හඳුනා ගනු ලබන අතර එය ඉදිරි ගිණුම් වර්ෂවල දී ඇති විය හැකි ආයතනයේ ලාභය සමඟ හිලව් කොට දැක්වීම සඳහා භාවිත කරනු ලැබේ.

විලම්භිත බදු, බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීමේ දී නීත්‍යානුකූල බලාත්මක වන අයුරින් බදු වත්කම් බදු වගකීම් සමඟ හිලව් කෙරේ.

පමාකරන ලද බදු වත්කම සෑදී ඇත්තේ ආයතනයේ ඉදිරියට ගෙනෙන ලද බදු අලාභය හේතුවෙනි. මෙය ආයතනයේ ගිණුම් ප්‍රකාශවලට ගෙන නැත්තේ එය අය කරවා ගැනීමට සාමාන්‍ය බදු කාලසීමාවට වඩා කාලයක් ගතවන බැවිනි. මෙය සටහන්වල දක්වා ඇත.

(ඇ) පිරිවැටුම මත පදනම් වූ බදු

පිරිවැටුම මත පදනම් වූ බදුවලට එකතු කළ අගය මත බද්ද (VAT) සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ඇතුළත් වේ.

2.2.21 සේවක ප්‍රතිලාභ මත වූ පිරිවැය

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ලෙස හඳුන්වනු ලබන්නේ වෘත්තීය සේවා කාලය නිම වීමෙන් පසු ක්‍රියාත්මක වන නිශ්චිත දායකත්ව සැලසුම හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මකි. ශේෂ පත්‍රයේ ආයතනික වගකීම නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මගින් ගණනය කොට ඇත්තේ 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා ගෙවීම පිළිබඳ පනතට අනුව වේ.

සේවකයෙකු වෙත විශ්‍රාම දීමනා ගෙවීමේ වගකීම පැන නගිනුයේ වසර 5 ක පූර්ණ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය. මෙම වගකීම ගිණුම් ප්‍රකාශනවල හඳුනා ගෙන ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ හිඟය හෝ අතිරික්තය වර්ෂය සඳහා ගණනය කරනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ට ප්‍රකාරව වන අතර යොදා ගත් උපකල්පන සටහන් අංක 17හි හෙළිදරව් කොට ඇත.

(ආ) සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සියලුම සේවක, සේවිකාවන් අර්ථසාධක අරමුදල යටතේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල යටතේ ලියාපදිංචි කොට ඇති අතර අදාළ වර්ෂයේ දී එම සේවක සේවිකාවන් සඳහා ගෙවිය යුතු දායක මුදල රෙගුලාසිවලට අනුව සම්පාදනය කොට ඇත .

සියලුම සේවකයින් සඳහා වූ අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සම්බන්ධ දායකත්වය වියදම් සිදු වූ ආකාරයට ලාභ අලාභ සැකසීමේ දී හඳුනා ගත හැක .

2.2.22 ආදායම් හඳුනා ගැනීම

(අ) භාණ්ඩ විකුණුම් ආදායම

භාණ්ඩයක් විකුණුම් ලෙස හඳුනා ගනු ලබන්නේ පාරිභෝගිකයා වෙත භාණ්ඩයේ අවධානම සහ අයිතිය හුවමාරු වන අවස්ථාවේ දීය.

(ආ) සේවා සැපයුම් ආදායම

සේවා විකුණුම්වලින් ලත් ආදායම හඳුනා ගනු ලබන්නේ සේවාවේ ප්‍රතිලාභ හුවමාරු වූ අවස්ථාවේ දී වන අතර එම ආදායම අදාල ගිණුම් වර්ෂයේ දී හඳුනා ගැනේ.

(ඇ) පොළී ආදායම

පොළී ආදායම හඳුනා ගනු ලබන්නේ උපචිත පදනම මත වේ.

(ඈ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් ද උපචිත පදනම මත හඳුනා ගනු ලබයි.

(ඉ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ/අලාභ හඳුනා ගනු ලබන්නේ එය බැහැර කළ වර්ෂය තුලයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

2.2.23 වියදම් හඳුනා ගැනීම

(අ) අයහාර වියදම්

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දී වියදම් හඳුනා ගනු ලබන්නේ ආදායම් ඉපැයීම සඳහා දැරූ පිරිවැය සහ එය මත සෘජු සම්බන්ධතාවය පදනම් කර ගැනීමෙනි.

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා දරනු ලබන පිරිවැය, ප්‍රාග්ධන නඩත්තු වියදම් ආදිය මෙහෙය වීමේ වියදම්, ආයතනික වියදම් ආදී කටයුතුවල ඵලදායිතාවය ඉහල නංවමින් ආදායම් ඉපැයීම සඳහා සිදු කළ වියදම් අයහාර වියදම් ලෙස දැක්වේ. වර්ෂ අවසානයේ මෙහි ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

(ආ) ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් දරනු ලබන්නේ වත්කමේ ස්වභාවය වැඩිදියුණු කිරීමටයි. එනම් ඵලදායිතාවය වැඩි කිරීම සඳහා දරන වියදම් වේ. එසේම ව්‍යාපාරය ඉදිරියට පවත්වා ගෙන යාමට හෝ එහි පරිමාණය වර්ධනය කිරීමට සහ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ප්‍රාග්ධන වියදම් දරනු ලැබේ.

(ඇ) ණය ගැනුම්

ආයතනය ප්‍රධාන ලෙස ණය මුදල් යොදා ඇත්තේ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් වැඩි කර ගැනීමට, ප්‍රතිග්‍රහනය සඳහා සහ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමටය. මෙහි දී ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් යොදා ඇති වටිනාකම / තක්සේරු අගය අදාල වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇති අතර අනෙකුත් සියළුම ණය ගැණුම් ආදායම් ප්‍රකාශයේ ගලපා දක්වා ඇත. ණය ගැණුම් යටතේ පොළී සහ ණය සම්බන්ධ අනෙකුත් වියදම් ද දක්වා ඇත.

(ඈ) ශුද්ධ මූල්‍යමය ආදායම්/වියදම්

මූල්‍යමය ආදායම් ලෙස බැංකු තැන්පතු ආයෝජන සඳහා පොළිය, සේවක ණය නැවත ගෙවීම් සහ මූල්‍යමය වත්කම් වල සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශයන්හි සටහන් කරනු ලැබේ. පොළී ආදායම් සංචිත පදනම මත සාධනීය පොළී ක්‍රමය මත හඳුනා ගෙන ඇත.

මූල්‍යමය වියදම් ලෙස පොළී වියදම්/ගෙවීම්, මූල්‍යමය වත්කම් සාධාරණ අගය වෙනස් වීම්, (අපහයන අලාභ) සහ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් කෙරෙහි ඉදිකිරීම් ප්‍රතිග්‍රහනයට අයත් නොවන වත්කම් ආදායම් ප්‍රකාශයෙහි සාධනීය පොළී ක්‍රමය යටතේ හඳුනා ගෙන ඇත.

(ඉ) බොල් ණය සඳහා වෙන් කිරීම්

මෙම වෙන් කිරීම හඳුනා ගනු ලබන්නේ වර්තමාන නීතිමය වගකීමක් හෝ අතීතයේ ඇති වූ සමහර ගනුදෙනු පදනම් කර ගනිමිනි. මෙම ගණුදෙනු නිරවුල් කිරීමේ දී මුදල් ප්‍රවාහ ආයතනයෙන් පිටතට ගලායන අතර මේ සඳහා යොදා ගන්නා වූ උපක්‍රමයක් ලෙස ඇස්තමේන්තුවක් ඇති කිරීම සාමාන්‍යයෙන් සිදු කරයි. තනි තනි ශේෂ සියුම් ලෙස පරීක්ෂා කර බොල් ණය වියදම් හඳුනාගත යුතුය. එසේ හඳුනා ගන්නා පිරිවැය ආවරණය කර ගැනීම උදෙසා ආයතනය විසින් ප්‍රමාණාත්මක ඇස්තමේන්තුවක් ඇති කර ගත යුතුයි.

2.2.24 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ආයතනයේ හෝ වෙනත් පරිබාහිර තුන්වන පාර්ශවයක් විසින් කරන්නා වූ ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ආයතනයේ මූල්‍ය ප්‍රතිපත්ති හා තීරණවලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් කල හැකි නම් හා එසේ සිදු වී ඇති නම් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළ යුතුය. අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 22 මගින් හෙලිදරව් කරනු ලබයි.

ආස්ථිත්වයේ සම්බන්ධිත පාර්ශව

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සම්බන්ධිත ඒකකයන් කිසිවක් නොමැත.

2.2.25 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙම ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය"වක්‍ර ක්‍රමය අනුව" සකස් කර ඇත.

2.2.26 අංශ තොරතුරු

ආයතනය නියැලී සිටින ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළින් උපයන ආදායම, දරන ලද වියදම මෙහෙයුම් අංශ තුළ ඇතුලත් වේ. ආයතනයේ අනෙකුත් අංශවලින් සිදුවන ගණුදෙනු සමඟ මෙහෙයුම් අංශ ආදායම සහ වියදම හඳුනා ගනු ලබයි. අංශවල සම්පත් බෙදා හැරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ කාර්යසාධන තක්සේරු කිරීම සඳහා සියළුම මෙහෙයුම් අංශවල මෙහෙයුම් ප්‍රතිඵල ක්‍රමවත් ලෙස ආයතනයේ කළමණාකාරීත්වය විසින් සමාලෝචනයට ලක් කරනු ලබයි.

මේ සඳහා වෙන් වෙන්ව පවතින මූල්‍ය තොරතුරු ලබාගත හැකිය. මේ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ සටහනක් මගින් හෙලිදරව් කර ඇත.

2.2.27 කොටසක ඉපැයුම

සාමාන්‍ය කොටසක් වෙනුවෙන් හිමි ලාභාංශ ආයතනයේ වර්ෂය තුළ ඇති බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදූ කල කොටසක ඉපැයුම ලැබේ.

2.2.28 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ගිණුම් කාල පරිච්ඡේදයේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන අධිකාරී බලයෙන් යුතුව නිකුත් කරන දිනයන් අතර කාලසීමාවේ දී මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ හැකි සතුටුදායක හෝ අසතුටුදායක සිද්ධි ඇති විය හැකිය. මේවා ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් ලෙස හැඳින්වේ.

මෙම සිද්ධි සලකා බලා මූල්‍ය ප්‍රකාශනවල යම් සංශෝධනයන් අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රමාණාත්මක හෙලිදරව් කිරීමක් හෝ ගැලපීමක් අවශ්‍ය නම් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කල යුතුය. වෙලෙස සිදුවීම් හට ගෙන නොමැති නම් ඒ අවස්ථාවල දී ගැලපීමක් අවශ්‍ය නොවේ. තවද අදාල කාලය තුළ ආයතනයේ ගැලපිය යුතු හෝ සටහන් විය යුතු මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ කිසිදු හේතුවක් නොවිය.

2.2.29 වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම්

වාර්තාකරණ දිනට පැවති වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 23 මගින් හෙළිදරව් කරයි.

2.2.30 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ ලෙස සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ වගකීම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

මූල්‍ය ප්‍රකාශන වල හෝ ආයතනයේ වංචා හා වැරදි ඇත්නම් ඒවා සොයා ගෙන ඒවාට පිළියම් යෙදීම, අවශ්‍ය අවස්ථාවල දී නව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ප්‍රමාණාත්මක ඇස්තමේන්තු ඇති කිරීම, තෝරා ගැනීම, භාවිතය සහ සමාලෝචනය කර අවශ්‍ය විටක සංශෝධනය කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 03 - ආදායම	2022 / 2023 රු.	2021 / 2022 රු.
දළ විකුණුම්	9,441,056,400	8,754,121,795
අඩු කළා : ආපසු එවුම්	(24,280,129)	(3,878,807)
ශුද්ධ විකුණුම් (සටහන 03.01)	**9,416,776,271**	**8,750,242,988**

සටහන 03.01 - වෙළඳ අංශ (ශුද්ධ විකුණුම්)	2022 / 2023 රු.	2021 / 2022 රු.
රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	989,466,830	1,017,779,819
තො.ස.තා. නිපැයුම්	358,777,332	809,072,989
කාර්යාල සැපයුම්	372,467,640	310,308,658
රථ වාහන ටයර් අංශය	242,593,285	247,936,198
තීරු බදු නිදහස් ප්‍රදර්ශනාගාරය	19,268,522	47,311,627
විදුලි සහ විද්‍යුත් උපකරණ	213,499,779	188,930,383
විශේෂ ව්‍යාපෘති ඒකකය	105,450,290	383,931,252
ගෘහස්ථ උපකරණ හා මෙවලම්	400,374,661	641,478,998
ඉදිකිරීම්, ලෝහ උපකරණ හා මෙවලම්	268,200,300	308,887,197
කෘෂි උපකරණ හා යාන්ත්‍රික උපකරණ	364,395,394	400,136,509
ස්වශක්ති බැටරි	67,982,942	65,075,722
අත්‍යවශ්‍ය ආහාර	6,014,299,297	4,329,393,636
	9,416,776,271	**8,750,242,988**

සටහන 03.02 - අංශ ගත මෙහෙයුම් ප්‍රතිඵල (දළ ලාභ)	2022 / 2023 රු.	2021 / 2022 රු.
රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	336,774,106	239,853,555
තො.ස.තා. නිපැයුම්	24,780,251	83,291,124
කාර්යාල සැපයුම්	110,702,911	74,368,095
රථ වාහන ටයර් අංශය	32,367,653	34,286,188
තීරු බදු නිදහස් ප්‍රදර්ශනාගාරය	6,009,146	20,346,487
විදුලි සහ විද්‍යුත් උපකරණ	32,480,523	30,964,040
විශේෂ ව්‍යාපෘති ඒකකය	17,868,546	51,982,586
ගෘහස්ථ උපකරණ හා මෙවලම්	64,927,777	71,182,448
ඉදිකිරීම්, ලෝහ උපකරණ හා මෙවලම්	31,077,606	38,357,992
කෘෂි උපකරණ හා යාන්ත්‍රික උපකරණ	61,221,547	57,018,170
ස්වශක්ති බැටරි	13,112,918	10,738,532
අත්‍යවශ්‍ය ආහාර	287,936,563	200,730,099
	1,019,259,548	**913,119,316**

සටහන 04 - අනෙකුත් මෙහෙයුම් ආදායම්	2022 / 2023 රු.	2021 / 2022 රු.
විනිමය මත ලාභ (අලාභ) DFS	(22,478)	94,335
විවිධ ආදායම් (සටහන 04.01)	46,298	14,197
ශ්‍රී.ල. පොලිස් දෙපාර්තමේන්තුව - කොමිස් ආදායම	-	5,621,132
ලිහා හළ තොග/ණය/අනෙකුත්	-	24,291,260
ශ්‍රී.ල. නාවික හමුදාව - කොමිස් ආදායම	-	1,754,428
ශ්‍රී.ල. යුධ හමුදාව - කොමිස් ආදායම	-	3,349,255
ඉපැයූ ආදායම සහ අනෙකුත් ආදායම් - ණය/කුලී පිට ගැනුම්	-	56,883
ස්ථාවර වත්කම් විකිණීම මත ලාභය	100,000	54,939
වෙළඳ තොගයට වත්කම් පැවැරුම මත ලාභය	2,252,197	-
කුලී ආදායම - රජවාස	12,221,436	12,915,417
කුලී ආදායම - රාජගිරිය පරිශ්‍රය	20,700,000	20,400,000
	35,297,453	**68,551,847**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

(සටහන 04.01) - විවිධ ආදායම	2022 / 2023 රු.	2021 / 2022 රු.
හානි වූ අයිතම විකිණීම	-	8,750
වෙනත්	46,298	5,447
	46,298	**14,197**

සටහන 05 - බෙදාහැරීමේ වියදම්	2022 / 2023 රු.	2021 / 2022 රු.
වෙළඳ සාම්පල් පරීක්ෂාව සහ සාම්පල් වියදම්	651,731	1,633,710
ටෙන්ඩර් පත්‍රිකා	479,230	450,424
සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමේ වියදම්	1,702,665	2,109,290
ගබඩා සහ ප්‍රදර්ශනාගාර කුලිය	41,331,197	27,238,845
ලොරි රථ කුලී/ප්‍රවාහන	8,293,605	5,843,386
සේවාකිරීම් ගාස්තු	1,001,015	2,971,995
විකුණුම් නියෝජිත කොමිස්	22,330,788	26,972,927
චකතු කිරීම වෙනුවෙන් කොමිස්	298,051	609,727
කාර්ය මණ්ඩල දිරිගැන්වීම්	-	9,978,207
බලපත්‍ර ගාස්තු- විකිණීම	89,486	1,198
විදේශ ගමන්	833,995	759,683
වෙළඳ ප්‍රවර්ධන වියදම්	424,114	3,438,110
දැන්වීම් ප්‍රචාරණය	1,035,463	2,147,158
භාණ්ඩ පැටවුම් සහ බෑම් වියදම්	272,000	28,400
අය කළ නොහැකි චකතු කළ අගය මත බදු	-	(16,255)
සහල් ආනයන / අපනයන වියදම්	50,139,315	1,978,144
ආයතනික ගනුදෙනුකරුවන් හට විකුණුම් ප්‍රවර්ධනය	-	199,646
වෙළඳ වට්ටම්	-	6,000,000
බිත්තර ආනයන වියදම්	44,090	-
සමාජ ආරක්ෂණ දායකත්ව බදු වියදම්	15,560,598	-
තොග හානි අලාභ	(16,441,863)	(9,730,290)
ණයගැතියන්ගේ හානි අලාභ	105,281,937	1,211,418
	233,327,415	**83,825,722**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 06 - පරිපාලන වියදම්

	2022 / 2023 රු.	2021 / 2022 රු.
වැටුප්	153,859,687	135,727,393
සේ.අ.අ.	23,658,608	23,824,061
සේ.භා.අ.	4,734,438	4,764,834
අතිකාල සහ විශේෂ දීමනා	25,309,490	34,342,811
ඇඳුම් අවරුදු උත්සව අත්තිකාරම්	6,430,000	16,905,960
කොන්ත්‍රාත් සහ අනියම් සේවක වැටුප්	45,134,944	43,028,618
කාර්යමණ්ඩල ප්‍රතිලාභ පිරිවැය	1,006,898	887,114
කාර්යමණ්ඩල සුබසාධනය	2,687,961	7,429,446
කාර්යමණ්ඩල වෛද්‍ය වියදම්	3,273,992	2,833,385
කාර්යමණ්ඩල වාහන සහ ඉන්ධන, ප්‍රවාහන, වෘත්තීය හා අනෙකුත් දීමනා	9,871,055	10,249,978
නිල ඇඳුම්	1,111,041	723,061
ශ්‍රම වියදම්	15,900	99,600
මරණ පාරිතෝෂිකය	200,000	1,000,000
ලබා නොගත් නිවාඩු සඳහා මුදල්	8,083,390	9,317,765
පාරිතෝෂික ප්‍රතිපාදනය	6,623,591	7,979,707
ගමන් සහ යැපීම් දීමනා	4,757,801	4,460,647
විගණන ගාස්තු	1,326,000	1,308,000
වෘත්තීමය සහ උපදේශන සේවා ගාස්තු	100,000	120,000
නෛතික ගාස්තු	187,042	655,845
ලේකම් කටයුතු සහ අනෙකුත් වියදම්	1,882,119	458,745
අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්	954,665	960,000
අධ්‍යක්ෂවරුන්ගේ දීමනා	848,000	750,000
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්	88,868	66,628
රක්ෂණ- සාමාන්‍ය	3,351,926	1,581,809
වරිපනම් සහ බදු	5,012,285	2,585,567
බලපත්‍ර ගාස්තු	1,225,318	17,660
දුරකථන ගාස්තු	10,071,789	9,363,845
විදුලි ගාස්තු	21,047,835	20,154,680
තැපැල් ගාස්තු	849,939	821,879
ජල ගාස්තු	2,538,332	1,533,063
පුවත්පත් සහ වාර ප්‍රකාශන	171,090	18,420
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	7,132,768	7,969,986
නඩත්තුව - ගොඩනැගිලි	6,611,701	899,660
නඩත්තුව - කාර්යාල උපකරණ	9,741,019	6,086,354
නඩත්තුව - ගබඩා උපකරණ	5,803,930	1,969,235
නඩත්තුව - ප්‍රදර්ශනාගාර	6,326,311	8,756,817
නඩත්තු සහ අනෙකුත් වියදම් - රජවාස	5,842,130	5,929,330
නඩත්තු සහ අනෙකුත් වියදම් - Q-Shop	1,978,341	4,106,924
නඩත්තුව - රථ වාහන	9,076,889	6,654,997
මෝටර් රථ වාහන ලියාපදිංචිය සහ රක්ෂණය	150,082	111,615
ඉන්ධන සහ ලිහිසි තෙල්	7,932,222	4,777,334
පරිගණක කළමනාකරණ ගාස්තු	1,022,323	608,000
පරිගණක නඩත්තුව	1,596,730	1,058,042
ක්ෂය කිරීම් - රථ වාහන	-	3,218
ක්ෂය කිරීම් - පිරියත හා උපකරණ	6,604,803	7,372,189
ක්ෂය කිරීම් - ලී බඩු	6,016,600	7,905,805
ක්ෂය කිරීම් - මෙවලම් හා උපකරණ	371,964	424,212
ක්ෂය කිරීම් - ප්‍රදර්ශනාගාර උපකරණ	2,182,007	1,082,614
බදුකරයට ලබාගත් පරිශ්‍රයන් මත ඉදිකළ කාර්යාල/ප්‍රදර්ශනාගාර ක්ෂයවීම, රජවාස ව්‍යාපෘතිය සහ Q-Shop ඉදිකිරීම	8,069,254	7,485,207
කාර්යමණ්ඩල සංවර්ධන සහ පුහුණු වියදම්	584,108	1,884,468
	433,457,185	**419,056,526**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 07 - ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	2022 / 2023 රු.	2021 / 2022 රු.
පොළී ආදායම		
කෙටිකාලීන තැන්පතු මත පොළී ආදායම	368,285,283	50,462,107
කාර්ය මණ්ඩල ණය මත පොළිය	1,169,056	1,452,319
පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ප්‍රතිවර්තනය	1,006,898	887,114
	370,461,238	**52,801,540**
මූල්‍ය වියදම		
අයිරා පොළිය	6,092,289	14,669,008
කෙටිකාලීන භාර ණය පොළිය	8,212,041	34,908,953
උත්සව ණය පොළිය	-	118,795
බැංකු පොළිය	8,493,365	9,175,789
	22,797,696	**58,872,545**
	347,663,542	**(6,071,005)**

සටහන 08 - ආදායම් බදු වියදම	සටහන්	2022 / 2023 රු.	2021 / 2022 රු.
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද - 2022/2023	08.01	222,987,787	50,099,087
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද - 2021/2022		433,506	-
තක්සේරු කිරීම් සඳහා ගෙවනු ලැබූ ආදායම් බද්ද		2,351,622	-
විලම්බිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය)	08.02	(26,101,761)	(139,901)
		199,671,154	**49,959,186**

(සටහන 8.1) ගිණුම්ගත ලාභය සහ ආදායම් බද්ද අතර සැසඳුම

මාර්තු 31න් අවසන් වසර සඳහා	2022 / 2023 රු.	2021 / 2022 රු.
බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය	735,435,943	472,717,948
ආයෝජන ආදායම	(368,285,283)	(83,777,524)
නොඉඩදුන් අයිතම එකතුව	110,739,039	14,890,511
ඉඩදුන් අයිතම එකතුව	(31,742,224)	(20,729,499)
ඉදිරියට ගෙනා බදු අලාභ උපයෝජනය	-	(256,326,493)
ගලපන ලද ව්‍යාපාරික ලාභය	**446,147,475**	**126,774,943**
ආයෝජන ආදායම	**368,285,283**	**83,777,524**
බදු අය කළ හැකි ආදායම	**814,432,758**	**210,552,467**
30% බැගින් වර්ෂය සඳහා ලාභ මත ආදායම් බද්ද	**222,987,787**	**50,532,592**

(සටහන 8.2) විලම්හිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය)

විලම්බිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය) පැන නැගුණේ :	2022 / 2023 රු.	2021 / 2022 රු.
විලම්හිත බදු වත්කම් සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	(26,509,551)	350,240
විලම්හිත බදු වගකීම් සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	(873,534)	1,711,676
ආයුගණක අලාභ සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	1,281,324	(2,201,817)
	(26,101,761)	**(139,901)**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 09 - කොටසක් සඳහා ඉපැයුම්

කොටසක් සඳහා මූලික ඉපැයුම්

කොටසක් සඳහා මූලික ඉපැයුම් ගණනය කරනු ලබන්නේ කොටස් හිමියන්ට ආරෝපණීය ශුද්ධ ලාභය වසර තුළ නිකුත් කළ සාමාන්‍ය කොටස්වල භරිත සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම මගිනි.

	2022 / 2023 රු.	2021 / 2022 රු.
කොටස් හිමියන්ට ආරෝපණීය ශුද්ධ ලාභය (රු. ශත)	535,764,789	422,758,725
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස්වල භරිත සාමාන්‍ය සංඛ්‍යාව	10,000,000	10,000,000
කොටසක් සඳහා මූලික ඉපැයුම්/(අලාභ) රු. ශත	**54**	**42**

කොටසක් සඳහා තනුක ඉපැයුම්

2023 මාර්තු 31න් අවසන් වූ වසර තුළ කිසිදු අවස්ථාවක නොපිය වූ තනුක භව්‍ය සාමාන්‍ය කොටස් නොතිබුණි. එබැවින් කොටසක් සඳහා තනුක ඉපැයුම් ඉහත වාර්තා කරන ලද කොටසක් සඳහා මූලික ඉපැයුම්වලට සමාන වේ.

සටහන 10 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය /ප්‍රත්‍යාගණනය	ඉඩම් රු.	ගොඩනැගිලි රු.	බදු පදනම් මත ලබාගෙන ඇති ගොඩනැගිලි රු.	ප්‍රදර්ශණාගාර උපකරණ රු.	මෝටර් රථ වාහන රු.	කාර්යාල උපකරණ රු.	පරිගණක රු.	මෙවලම් සහ උපකරණ රු.	ගෘහ භාණ්ඩ හා සවිකිරීම් රු.	එකතුව රු.
2022 අප්‍රේල් 01 දිනට	226,240,000	52,123,790	336,011,720	32,532,362	86,209,348	45,731,743	52,003,737	4,232,233	79,101,242	914,186,176
වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය	-	-	-		104,369,977	-	-	-	-	104,369,977
එකතුකිරීම්	-	-	28,989,557	5,776,622	-	766,280	1,376,105	372,520	661,631	37,942,715
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ පිරිවැය	-	-	-	-	-	-	67,950	-	3,112,122	3,180,072
2023 මාර්තු 31 දිනට ශේෂය	**226,240,000**	**52,123,790**	**365,001,277**	**38,308,984**	**190,579,325**	**46,498,023**	**53,311,892**	**4,604,753**	**76,650,751**	**1,053,318,795**
ක්ෂයවීම/හානිවීම	-	-	-	-	-	-	-	-	-	
2022 අප්‍රේල් 01 දිනට	-	52,123,787	168,203,319	7,302,458	86,209,313	24,256,251	48,500,741	2,429,310	58,960,607	447,985,786
වසර සඳහා ක්ෂය ගාස්තුව	-	-	26,738,315	7,950,628	-	3,927,450	2,677,353	371,964	6,016,600	47,682,310
සමුච්චිත ක්ෂීම් සඳහා ගැලපීම්	-	-	-	-	-	(1,509,470)	(1,604,624)	(95,068)	(3,458,387)	(6,667,548)
ස්ථාවර වත්කම් බැහැර කිරීම් වල සමුච්චිත ක්ෂය	-	-					67,950		2,225,163	2,293,113
2023 මාර්තු 31 දිනට ශේෂය	**-**	**52,123,787**	**194,941,634**	**15,253,086**	**86,209,325**	**26,674,231**	**49,505,520**	**2,706,206**	**59,293,658**	**486,707,435**
2022 අප්‍රේල් 01 දිනට ශේෂය	226,240,000	3	167,808,401	25,229,904	35	21,475,493	3,502,996	1,802,923	20,140,635	466,200,388
2023 මාර්තු 31 දිනට ශේෂය	**226,240,000**	**3**	**170,059,643**	**23,055,898**	**104,370,000**	**19,823,793**	**3,806,372**	**1,898,547**	**17,357,092**	**566,611,360**

සටහන 10අ - අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය /ප්‍රත්‍යාගණනය	පරිගණක මෘදුකාංග රු.	එකතුව රු.
2022 අප්‍රේල් 01 දිනට ශේෂය	14,491,580	14,491,580
වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය	9,330,000	9,330,000
2023 මාර්තු 31 දිනට ශේෂය	**23,821,580**	**14,491,580**
ක්ෂයවීම/හානිවීම		
2023 අප්‍රේල් 01 දිනට ශේෂය	14,491,579	14,491,579
2023 මාර්තු 31 දිනට ශේෂය	**14,491,579**	**14,491,579**
2022 අප්‍රේල් 01 දිනට වටිනාකම රැගෙන යාම	1	1
2023 මාර්තු 31 දිනට වටිනාකම රැගෙන යාම	**9,330,001**	**9,330,001**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 11 - කොටස්වල ආයෝජන

	2022 / 2023 රු.	2021 / 2022 රු.
එස් ටී සී මෙඩිකල් ලිමිටඩ්	49,990	49,990
අඩු කළා : එස් ටී සී මෙඩිකල් ලිමිටඩ් කොටස්වල ආයෝජනයේ අගය කපා හැරීම	(49,990)	(49,990)
	-	-
ලංකා නැව් සමාගම	20	20
	20	**20**

සටහන 12 අ - කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය

	සටහන්	2022 / 2023 රු.	2021 / 2022 රු.
ජංගම නොවන			
කාර්ය මණ්ඩල ණය	12.1	13,833,661	11,140,493
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	12.2	1,589,005	831,125
		15,422,666	**11,971,618**
ජංගම			
කාර්ය මණ්ඩල ණය	12.1	5,863,185	5,216,060
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	12.2	1,128,269	659,817
		6,991,454	**5,875,877**
		22,414,120	**17,847,495**

සටහන 12.1 - කාර්ය මණ්ඩල ණය

	2022 / 2023 රු.	2021 / 2022 රු.
වර්ෂය ආරම්භයේ දී ශේෂය	17,847,495	18,222,887
වර්ෂය තුල ප්‍රදානය කළ ණය	13,916,500	7,793,500
ආපසු අය කර ගත් ණය	(9,349,874)	(8,168,892)
	22,414,121	**17,847,495**
පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ වෙත පැවැරුම	(2,717,272)	(1,490,942)
වසර අවසානයේ දී ශේෂය	**19,696,849**	**16,356,553**
ජංගම නොවන	13,833,661	11,140,493
ජංගම	5,863,185	5,216,060
	19,696,846	**16,356,553**

සටහන 12.2 - පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

	2022 / 2023 රු.	2021 / 2022 රු.
වසර ආරම්භයේ දී ශේෂය	1,490,942	1,472,567
වසර තුළ වකතු කිරීම්	2,293,228	905,489
ක්‍රමක්ෂය	(1,006,898)	(887,114)
වසර අවසානයේ දී ශේෂය	**2,777,272**	**1,490,942**
ජංගම නොවන	1,589,005	831,125
ජංගම	1,128,269	659,817
	2,717,274	**1,490,942**

සමාගම සහනදායී අනුපාත යටතේ සේවකයන්ට ණය ලබා දෙයි. ඒ හා සමාන ණය සඳහා වෙළඳපොළ ආශ්‍රිත අනුපාත භාවිත කරමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම මගින් සේවක ණයවල සාධාරණ වටිනාකම නිර්ණය කරනු ලැබේ. සේවක ණයවල පිරිවැය සහ සාධාරණ වටිනාකම අතර වෙනස්කම් හඳුනා ගනු ලබනුයේ පෙර ගෙවූ කාර්යමණ්ඩල ප්‍රතිලාභ ලෙසය. මෙම ණය ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 12 ආ - පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමය	සටහන්	2022 / 2023 රු.	2021 / 2022 රු.
ජංගම නොවන			
දළ ආයෝජනය	12.3	-	-
අඩු කළා : නොඉපැයූ මූල්‍ය ආදායම	12.4	-	-
		-	-
ජංගම			
දළ ආයෝජනය	12.3	-	9,393
අඩු කළා : නොඉපැයූ මූල්‍ය ආදායම	12.4	-	(164)
		-	**9,229**
		-	**9,229**

සටහන 12.3 - දළ ආයෝජනය

වසර ආරම්භයේ දී ශේෂය	9,230	796,006
වසර තුළ දළ ආයෝජනය	-	-
අඩු කළා : ලැබුණු කුලී	(9,230)	(786,776)
	0.00	**9,230**
එකතු කළා : නොඉපැයූ මූල්‍ය ආදායම		164
වසර අවසානයේ දී ශේෂය	**0.00**	**9,393**
	-	
ජංගම නොවන		-
ජංගම	-	9,393
	-	**9,393**

සටහන 12.4 - නොඉපැයූ මූල්‍ය ආදායම

වසර ආරම්භයේ දී ශේෂය	164	69,830
වසර තුළ ලබා ගත් ණය	-	-
අඩු කළා: වසර සඳහා පොළී ආදායම	(164)	(69,666)
වර්ෂය අවසානයේ දී ශේෂය	**(0)**	**164**
ජංගම නොවන	-	-
ජංගම		164
	-	**164**

සටහන 13 - තොග	2022 / 2023 රු.	2021 / 2022 රු.
අවසන් තොගය	529,846,415	682,773,397
මාර්ගස්ථ භාණ්ඩ	953,673,309	848,733,262
හානි වූ සහ සෙමෙන් අළෙවි වන තොග සඳහා ප්‍රතිපාදනය	(16,330,350)	(33,539,626)
	1,467,189,374	**1,497,967,033**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 14 - වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	2022 / 2023 රු.	2021 / 2022 රු.
වෙළඳ ණයගැතියෝ	338,829,077	995,268,965
ණයගැති හානි සඳහා අඩුකිරීම්	(115,685,704)	(10,403,767)
	223,143,373	**984,865,197**
වෙනත් ලැබීම්	13,902,500	18,700,000
උත්සව අත්තිකාරම	2,346,750	69,250
උත්සව ණය	-	5,365
විදුලිය සඳහා තැන්පතු	879,500	878,000
ආරක්ෂිත තැන්පතු -ජා.ඉ. බැංකුව	1,069,845	1,037,720
බහාලුම් තැන්පතු	45,000	280,000
කුලී මුදල් තැන්පතු	21,428,789	22,528,789
විවිධ තැන්පතු	906,500	606,500
වරාය අධිකාරිය - PVQ	50,000	50,000
ලංසු බැඳුම්කර ගිණුම	21,380	29,075
පෙර ගෙවුම්	113,727,210	13,583,492
සුළු මුදල්වලින් කාර්යමණ්ඩල අත්තිකාරම්	48,500	38,900
ඇපකර - මහජන බැංකුව	600,000	600,000
ලැබිය යුතු පොළිය	232,708,493	17,881,874
ලැබියයුතු රැඳවුම් බද්ද	46,413	46,413
අධ්‍යාපන දෙපාර්තමේන්තුව	7,784,039	7,784,039
විවිධ වියදම් අත්තිකාරම	1,111,953	451,224
සේවා සඳහා අත්තිකාරම්	203,195	786,551
අනෙකුත් ගෙවිය යුතු දෑ මත අත්තිකාරම	4,517,081	4,517,081
Q-Shop සඳහා අත්තිකාරම්	34,260	275,614
බදු කුලී අත්තිකාරම ගෙවීම - පළමු වසර	212,500	112,500
ආරක්ෂිත තැන්පතු - Q shop	191,128	191,128
නැව්ගාස්තු ඇප සහතික ආන්තිකය- මහජන බැංකුව	-	56,906,475
නැව් ගාස්තු ඇප සහතික ආන්තිකය -සම්පත් බැංකුව	14,946,000	-
නැව් ගාස්තු ඇප සහතික ආන්තිකය ලංකා බැංකුව	-	8,186,178
තෑගි වවුචර් පාලන ගිණුම	-	23,000
කාර්යමණ්ඩල ණයගැතියෝ -වැටුප් අත්තිකාරම	46,250	54,250
අයකරගත යුතු තොග ඌනතා ගිණුම - Q වෙළඳහල්	185,397	-
ඩේවිඩ් පීරිස් මෝටර් රථ සමාගම	1,074,440	1,074,440
අබලි බැටරි පාලන ගිණුම	299,923	211,629
සයන්ටර් ටෙක්නොලොජීස් (පුද්) සමාගම	1,805,000	1,805,000
වෙළඳ අමාත්‍යාංශය	-	576,061
වෙළෙඳ අමාත්‍යාංශය - ආනයනික සහල් මිල සහනාධාර ලැබීම්	-	1,209,838,823
ණය/ කුලීපිට ගැනුම්, කුලී, රක්ෂණ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	4,688,217	4,702,132
නාම පුවරුව සඳහා අයකර ගැනීම් - රජවාස	153,000	153,000
	648,176,634	**2,358,849,700**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 15 - අතැති මුදල් සහ මුදලට සමාන දෑ

	2022 / 2023 රු.	2021 / 2022 රු.
බැංකුවේ ඇති මුදල්		
ලංකා බැංකුව (ගි.අ. 8859546)	270,158	270,158
සම්පත් බැංකුව (ගි.අ. 000930000337)	1,354,218	4,245,877
සම්පත් බැංකුව - තීරු බදු රහිත සාප්පුව (ගි/අ. 002930006974)	131,660	-
ලංකා බැංකුව (ගි.අ. හඳ 1060)	93,358	73,940,432
ජා.ස.බැංකුව (ගි.අ. - 101000160408)	478,506	505,927
මහජන බැංකුව - කුරුණෑගල	1,015,315	-
මහජන බැංකුව - මහනුවර	1,312,850	1,277,555
මහජන බැංකුව - මාතර	1,006,750	1,043,286
මහජන බැංකුව - කල්මුණේ	1,000,000	872,305
මහජන බැංකුව - පොලොන්නරුව	-	382
මහජන බැංකුව - සහල් 004 1001 8 0206579	614,901	467,503,401
මහජන බැංකුව - සහල් 004 1002 7 0206579	81,951	-
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	25,474	-
සුළු මුදල් අග්‍රිමය	873,019	624,779
අතැති මුදල්	5,216,191	19,205,743
	13,474,352	**569,489,844**

සටහන 16 - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

	2022 / 2023 රු.	2021 / 2022 රු.
වසර ආරම්භයේ දී ශේෂය	39,164,924	46,296,906
වසර තුළ වෙන් කළ ප්‍රතිපාදනය	10,894,671	(1,397,512)
වසර තුළ සිදු කළ ගෙවීම්	(15,815,878)	(5,734,470)
වසර අවසානයේ දී ශේෂය	**34,243,718**	**39,164,924**

ප්‍රතිලාභ ගණනය කිරීම පිණිස කළමනාකාරිත්වය විසින් යොදා ගනු ලැබ ඇති තක්සේරු ක්‍රමය වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 'කාර්ය මණ්ඩල ප්‍රතිලාභ' මගින් නිර්දේශ කරනු ලැබ ඇති 'ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමයයි'.

වසර මුළුල්ලෙහි විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ සංචලනය පහත පරිදි වේ.

	2022 / 2023 රු.	2021 / 2022 රු.
පොළී වියදම	4,660,438	5,533,756
වත්මන් සේවා වියදම	1,963,154	2,242,967
කාර්ය මණ්ඩල පිරිවැයේ ඇතුලත් කර ඇති මුළු ප්‍රමාණය	**6,623,591**	**7,776,723**
හඳුනා ගත් සත්‍ය ශුද්ධ ලාභ/අලාභ	4,271,080	(9,174,235)
හඳුනා ගත් මුළු විස්තීරණ ආදායම	**10,894,671**	**(1,397,512)**

කළමනාකාරිත්වය විසින් භාවිත කරනු ලැබූ ප්‍රධාන උපකල්පනයන්ට පහත දෑ අන්තර්ගත වේ.

මූල්‍ය උපකල්පන	31.03.2023	31.03.2022
වාර්ෂික පොළී අනුපාතය	12%	12%
වැටුප් වැඩි වීමේ අනුපාතය	1%	1%
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	13%	8%
විශ්‍රාම යාමේ වයස (අවුරුදු)	60	60

සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවතිනු ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 17 - ශුද්ධ විලම්භිත බදු වගකීම (වත්කම)

	2022 / 2023 රු.	2021 / 2022 රු.
වසර ආරම්භයේ දී ශේෂය	(13,649,744)	(15,711,660)
වසර සඳහා ප්‍රතිපාදනය/ප්‍රතිවර්තනය	(27,383,085)	2,061,916
වසර අවසානයේ ශේෂය	**(41,032,830)**	**(13,649,744)**

විලම්භිත බදු ගණනය කරනු ලබන්නේ ස්ථාවර වත්කම්වල ධාරණ වටිනාකම සහ බදු අය කළ හැකි එක් එක් ක්‍රියාකාරකම මගින් විශ්ලේෂණය කළ පරිදි එවැනි වත්කම්වල බදු ලියා හළ අගය අතර තාවකාලික වෙනස්කම් ලෙසය.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම් ආශ්‍රිත කාල වෙනස්කම්වලින් පැන නගින බදු බලපෑමේ සැසඳුම පහත පරිදිය.

	2022 / 2023 රු.	2021 / 2023 රු.
සෙමින් අළෙවි වන තොග සඳහා ප්‍රතිපාදනය	3,150,405	2,335,270
බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය	(32,209,184)	(290,364)
සේවක ප්‍රතිලාභ වගකීම	(873,534)	1,711,676
බදු කාර්යයන් සඳහා ත්වරිත ක්ෂය	2,549,227	(1,694,666)
	(27,383,086)	**2,061,916**

සටහන 18 - කෙටිකාලීන ණය ගැනුම්

	2022 / 2023 රු.	2021 / 2022 රු.
ජංගම වගකීම්		
කෙටිකාලීන		
කාලීන ණය - සම්පත් බැංකුව	13,600,000	-
මුළු ණය වගකීම	**13,600,000**	**-**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 19 - වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	2022 / 2023 රු.	2021 / 2022 රු.
වෙළඳ ණයහිමියෝ	290,036,187	521,056,008
විදේශ ආනයන වගකීම	1,580,420,481	3,576,133,635
උපචිත වියදම්	52,040,751	57,260,929
ගෙවිය යුතු වැකතු කළ අගය මත බදු	2,909,027	4,860,269
ගෙවිය යුතු ආදායම් බදු	221,332,030	40,397,033
අනෙකුත් ණයහිමියෝ - විවිධ	1,887,719	2,428,966
විගණන ගාස්තු	2,652,000	2,520,000
ආරක්ෂිත තැන්පතුව - ජා. ඉ. බැංකුව	1,069,845	1,037,720
සේ. අ. අ.	3,004,700	3,535,143
සේ. භා. අ.	360,564	424,217
කාර්ය මණ්ඩල ණයහිමියෝ - නැවත බැංකු ගත කළ වැටුප් ආදිය	714,355	586,126
වැටුප් අඩු කිරීම්	366,178	791,108
වැටුප් අඩු කිරීම් - කාර්ය මණ්ඩලය සහ අනෙකුත්	5,504	28,893
ඒඞීසී ට්‍රේඩ් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්	1,041,629	1,041,629
සාලා එන්ටප්‍රයිසස්	94,507	94,507
අබාන්ස් (පුද්) සමාගම	1,920,661	1,920,661
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	285,000	260,000
ගෙවිය යුතු රඳවාගැනීමේ බදු	27,500	-
එටිසලාට් ණය කාඩ්පත්	748,683	748,683
නොමිලේ නිකුත් කරන භාණ්ඩ පාලන ගිණුම	109,584	109,584
මුද්දර ගාස්තු වියදම් අය කර ගැනීම	24,975	28,100
ණය/කුලී පිට ගැනුම් අත්තිකාරම	1,191,883	1,191,883
කල්බදු උපකරණ සඳහා ණයහිමියෝ	118,310	165,012
ලැබිය යුතු මුදල් - වර්ෂ අවසාන වෙළඳ ප්‍රවර්ධන වියදම්	1,641,069	2,022,369
ලැබිය යුතු මුදල් - යාපනය ප්‍රදර්ශනාගාරය	415,128	415,128
ණය/කුලී පිට ගැනුම් සඳහා ගෙවිය යුතු රක්ෂණය	49,232	49,232
ස්ටැෆඩ් මෝටර් (පුද්) සමාගම	28,000	28,000
රඳවා ගැනීම	4,213,981	4,192,963
සේවා කොන්ත්‍රාත් මත රඳවා ගැනීම	2,590,392	2,055,864
ආදායම අහිමි වීම පියවීමේ ගිණුම - යාපනය ප්‍රදර්ශනාගාරය	238,765	238,765
සංවර්ධන නිලධාරී සඳහා වැටුප් ප්‍රතිපූර්ණය - වෙළඳ අමාත්‍යාංශය	642,394	-
සහල් ආනයනය සඳහා කාරක ප්‍රාග්ධනය	200,000,000	200,000,000
වෙනත් ණය හිමියෝ - කාර්මික සංවර්ධන මණ්ඩලය	-	200,000
ආපසු නොගෙවියයුතු ආරක්ෂක තැන්පතු - රජවාස	11,025,956	10,935,403
	2,383,206,991	**4,436,757,832**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 20 - බැංකු අයිරා

	2022 / 2023 රු.	2021 / 2022 රු.
මහජන බැංකුව (ගිණුම් අංකය 004100120210918)	105,939,957	135,154,900
සම්පත් බැංකුව - DFS (ගිණුම් අංකය 002930006974)	-	23,721,292
මහජන බැංකුව - කුරුණෑගල	-	145,709
	105,939,957	**159,021,901**

සටහන 21 - රජයේ ප්‍රදානය විලම්භිත ආදායම් ගිණුම

	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-1 රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-2 (රජවාස) රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-3 (Q Shop බහාලුම් වියදම්) රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-4 (Q Shop ඉදිකිරීම් වියදම්) රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-5 (රජවාස මඩකලපුව) රු.	එකතුව රු.
වසර ආරම්භයේදී ශේෂය	38,208,283	84,876,348	6,840,000	21,238,593	-	151,163,223
වසර තුළ රජයේ ප්‍රදාන	-	-	-	1,379,052	22,924,908	24,303,960
වෙළඳ අමාත්‍යාංශය වෙත මුදල් ආපසු ගෙවීම	-	-	(6,840,000)	-	-	(6,840,000)
එකතුව	**38,208,283**	**84,876,348**	**-**	**22,617,645**	**22,924,908**	**168,627,183**
ලාභ/අලාභ ගිණුමට අයකලා 2022/2023	6,368,047	7,716,032	-	5,768,621	4,584,982	24,437,682
වසර අවසානයේදී ශේෂය	**31,840,235**	**77,160,316**	**-**	**16,849,024**	**18,339,927**	**144,189,502**

සටහන 22 - සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු

අ) ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 -'සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම' ප්‍රකාරව, ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු අස්තිත්වයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මග පෙන්වීම සහ පාලනය කිරීම සඳහා අධිකාරිය සහ වගකීම ඇති අය වේ. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළුව), අධ්‍යක්ෂ මණ්ඩලයට ආසන්නම පහළ මට්ටමේ සිටින සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සංස්ථාවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර තිබේ.

(i) අධ්‍යක්ෂවරුන් සඳහා ණය

සමාගමේ අධ්‍යක්ෂවරුන්ට කිසිදු ණයක් ප්‍රදානය කොට නොමැත.

(ii) ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග වෙනත් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන 22(**අ**)හි හෙළිදරව් කර ඇති ගනුදෙනු හැර ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

සටහන 23 - ප්‍රාග්ධන වගකීම්

2023 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ගිවිසුම්කර ප්‍රාග්ධන වියදම් සහ අවිනිශ්චිතතාවයන් නොතිබුණි.

සටහන 24 - සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනය පහසු කිරීම පිණිස, පෙර වර්ෂය හා සම්බන්ධ අදාළ ශේෂ ප්‍රවර්තන වසරේ වර්ගීකරණයට අනුකූල වන සේ නැවත වර්ගීකරණය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022/2023

සටහන 25 - මූල්‍ය අවදානම් කළමනාකරණය

දළ විශ්ලේෂණය

මූල්‍ය උපකරණ භාවිතයෙන් පහත දැක්වෙන අවදානම්වලට සංස්ථාව නිරාවරණය වේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළඳපොළ අවදානම (ව්‍යවහාර මුදල් අවදානම සහ පොළී අනුපතා අවදානම ඇතුළුව)

ඉහත එක් එක් අවදානම වෙත සංස්ථාවේ නිරාවරණය පිළිබඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සහ අවදානම මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා සංස්ථාවේ අරමුණු, ප්‍රතිපත්ති සහ පරිපාටි මෙම සටහන ඉදිරිපත් කරයි.

අවදානම් කළමනාකරණ රාමුව

සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සංස්ථාවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපනය කරනු ලබනුයේ සංස්ථාව විසින් මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීමටත්, උචිත අවදානම් සීමා සහ පාලන පැන වීමටත් අවදානම් සහ සීමාවන්ට අනුගත වීම අධීක්ෂණය කිරීමටත්ය. වෙළඳපොළ තත්ත්වයන් සහ සමාගමේ ක්‍රියාකාරකම් පිළිඹිබු කිරීම පිණිස අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

ණය අවදානම

ණය අවදානම යනු පාරිභෝගිකයකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිපාර්ශවය සිය ගිවිසුම්කර බැඳීම් සපුරාලීමට අපොහොසත් වුවහොත් සිදුවන මූල්‍ය අලාභය වන අතර එය මූලික වශයෙන් පැන නගිනුයේ පාරිභෝගිකයින්ගෙන් සහ ආයෝජන සුරැකුම්පත්වලින් සංස්ථාවට ලැබිය යුතු දෑවලිනි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීම මගින් පියවනු ලබන තම මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් සපුරාලීමේ දී සංස්ථාව මුහුණ දෙන අවදානම වේ. මෙම අවදානම කළමනාකරණය කිරීමේ දී සංස්ථාවේ ප්‍රවේශය වනුයේ, පිළිගත නොහැකි අලාභ හෝ සංස්ථාවේ කීර්තිනාමයට සිදුවන හානිවලින් තොරව, ගෙවිය යුතු අවස්ථාව වන විට තම වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් තමන් සතුව සැම විටම පවතින බව හැකිතාක් දුරට සහතික කිරීමයි.

ද්‍රවශීලතා අවදානම මැනීම සහ අවම කිරීම පිණිස සංස්ථාව තම ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමීපව අධීක්ෂණය කර, මුදල් හා මුදල් සමාන දෑ ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගත් අතර මූල්‍ය ආයතනවලින් විකඟ වූ අරමුදල් පහසුකම් ලබා ගන්නා ලදී.

වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු විදේශ විනිමය අනුපාත, පොළී අනුපාත ආදිය වැනි වෙළඳපොළ මිල වෙනස්වීම්, සංස්ථාවේ ආදායම හෝ මූල්‍ය උපකරණවල එහි කොටස් වටිනාකම කෙරෙහි බලපෑමේ අවදානමයි. වෙළඳපොළ අවදානම කළමනාකරණය කිරීමේ අරමුණ වනුයේ ලාභ ප්‍රශස්ත කරමින් පිළිගත් පරාමිතීන් තුළ වෙළඳපොළ අවදානම් පාලනය හා කළමනාකරණය කිරීමයි.

පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල වෙනස්කම් හේතුවෙන් මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහ විචලනය වීමේ අවදානමයි. වෙළඳපොළ පොළී අනුපාත ප්‍රධාන කොටම සම්බන්ධ වනුයේ සංස්ථාවේ දිගුකාලීන ණය බැඳීමට සහ පාවෙන පොළී අනුපාත සහිත ආයෝජනයන්ටය. කෙසේවෙතත්, වාර්තාකරණ දිනයට සැලකිය යුතු පොළී අනුපාත අවදානමක් ඇතිකරන්නා වූ ප්‍රමාණාත්මක දිගුකාලීන පාවෙන අනුපාත ණය ගැනුම් හෝ තැන්පතු සමාගම සතුව නොමැත.